ISSN 2279-2120

# ප්‍රලේඛා

2 වෙළුම 1 කලාපය 2013 ජූනි - අගෝස්තු ත්‍රෛමාසිකය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන සේවා අමාත්‍යාංශය

14 වන සියවසේ කාශ්‍යප රජු විසින් නිර්මාණය කරන ලද,
ලෝකයේ 08වන පුදුමය ලෙස සැලෙකෙන

# සීගිරිය

ශ්‍රී ලාංකේය අපට සම්පතකි.

අඩ සියවසකට ආසන්න කාලයක් රටට සමෘද්ධිය උදාකරමින්

වැඩිම කෝටිපතියන් බිහිකළ

# මහජන සම්පත

අපට සම්පතකි.






අනුග්‍රාහක දායකත්වය

ඔබත් හදන - රටත් හදන

**ජාතික ලොතරැයි මණ්ඩලය**

ඔබත් හදන රටත් හදන

**ජාතික ලොතරැයි මණ්ඩලය**

# ප්‍රලේඛා

02 වන වෙළුම - 01 කලාපය

ISSN 2279-2120

උපදේශකත්වය
මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

සංස්කරණය
මාලිනි ගෝවින්නගේ

සම්බන්ධීකරණය
මෛත්‍රී ජයසුන්දර
සහකාර අධ්‍යක්ෂ

පිටු සැලසුම හා කවර නිර්මාණය
ප්‍රේම් දිසානායක
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ප්‍රකාශනය
ව්‍යාප්ති සේවා
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන: 011-2687583, 011-2698847-283
ෆැක්ස්: 011-2674387
ඊ මේල්: pub@mail.natlib.lk
වෙබ් අඩවිය: www.natlib.lk

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

කලාපයක මිල: රු. 150.00
වාර්ෂික දායකත්වය: රු. 900.00

චෙක්පත් හා මුදල් ඇණවුම්:
සභාපති, ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය
නමට යොමු කරන්න.

මුද්‍රණය:
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

## සංස්කාරක සටහන

සරල ශාස්ත්‍රීය ලිපි හා ගද්‍ය පද්‍ය සාහිත්‍ය ලිපි සරණියක් ලෙස ප්‍රලේඛා දෙවන කලාපය ඔබ අතට පත්වෙයි. මින් ඉදිරියට ත්‍රෛමාසිකයක් ලෙස ප්‍රකාශයට පත්වන ප්‍රලේඛා හී අන්තර්ගතය සාහිත්‍යය හා ලේඛන කලාවට සීමා නොවී ජනමාධ්‍ය, සිනමාව, වේදිකාව හා ප්‍රචාරණ කලාව ද ඇතුළු මානව ශාස්ත්‍ර විෂයයන් පිළිබඳ ශාස්ත්‍රීය නැඹුරුවක් සහිත ලිපිවලට ද වෙන්වනු ඇත.

ප්‍රවීණ මෙන්ම නව පරපුරේ නිර්මාණකරුවන් හා නිර්මාණකාරියන්, ශාස්ත්‍රවන්තයන් හා ශාස්ත්‍රවන්තියන් සඳහා ප්‍රලේඛා තුළින් වේදිකාවක් සැපයීම අපේ අපේක්ෂාවයි. ලිපි සම්පාදනයෙන් මෙන්ම සඟරාවේ උන්නතිය සඳහා නව යෝජනා ඉදිරිපත් කිරීමෙන් ද ප්‍රලේඛා සමඟ එක්වන්නැයි ඇරියුම් කරමු.

අපේ ලිපිනය:
ප්‍රලේඛා
ව්‍යාප්ති සේවා අංශය,
ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.

මෙහි පළවන ලිපි පිළිබඳ වගකීම
අදාල ලේඛකයින් සතු වේ.

182998
25 JUN 2013
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

# අත්වැල

ඉකුත් දෙවසරේ අස්වැන්නෙන් බිඳක් 3
එඩ්මන්ඩ් ජයසූරිය

පොත් අලෙවිය සාර්ථක කර ගැනීමට නම්... 13
ජයසිරි අලවත්ත

ගේට්ටුවේ අමුත්තෝ (කෙටිකතාව) 18
කපිල කුමාර කාලිංග

පුස්තකාලයාධිපතිගේ පර්යේෂක භූමිකාව 26
එච්.එම්. ගුණරත්න බණ්ඩා

අම්මා සහ අපේ ගේ (කවිය) 31
මංජුල වෙඩිවර්ධන

අවවර්ධිත සමාජ සම්ප්‍රදායක හුදෙකලා වූ කලාකරුවා සයිමන් නවගත්තේගම 33
පියල් කාරියවසම්

පිකාසො නූතන චිත්‍ර/මූර්ති කලාවේ පුරාවත 36
මන්තිකා

පොතක වත 42

வாசிப்பும் நேசிப்பும் 46
தும்பிஜயா தேவதாஸ்

FREEDOM AND THE WRITER 51
Prof. Ediriweera Sarachchandra

"පොත් කියවීමට වෙලාවක් නෑ" - සමීක්ෂණයකින් හෙළිවේ 56
ධර්මදාස පරණගම

## අද සිංහල නවකතාව

# ඉකුත් දෙවසරේ අස්වැන්නෙන් බිඳක්

පළමුවන සිංහල නවකතාව බිහිවී වසර 100ක් පමණ ගත වන අද නවකතාවේ විෂය ක්ෂේත්‍රය පුළුල් වී ඇත. අවිච්ඡින්නව ගලා යන කලා ප්‍රවාහයක එය එසේ සිදුවිය යුත්තකි. ඒ ඒ නවකතාකරුවා නවකතාව ලිවීමට පෙලඹෙන්නේ තමාටම විශේෂ වූ හේතුවක් නිසාය. නිදර්ශනයක් වශයෙන්, පියදාස සිරිසේන නවකතා ලියන්නට ඇත්තේ සමාජ ශෝධනය සඳහා විය යුතුය. මෙය මෙරටට පමණක් නොව බොහෝ රටවල නවකතාකරුවන්ට පොදු ධර්මතාවකි. ඉංග්‍රීසි සාහිත්‍යය දෙස බැලුවොත් ඉංග්‍රීසි නවකතාව පිළිබඳව මාහැඟි විචාර ග්‍රන්ථයක් ලියූ වෝල්ටර් ඇලන් සඳහන් කරන පරිදි සැමුවෙල් රිචර්ඩ්සන් නවකතා ලීවේ පාඨකයා තුළ හොඳ සිරිත් විරිත් ඇති කිරීම පිණිසය. හෙන්රි ෆිල්ඩින් නවකතා ලීවේ සිය යුගයේ චාරිත්‍ර වාරිත්‍ර වෙනස් කරනු පිණිසය. සමාජ දුරාචාරය අනාවරණය කරණු පිණිස චාර්ල්ස් ඩිකන්ස් නවකතා ලියූ අතර, ඇන්තනී ට්‍රෝලොප් නවකතා ලියා ඇත්තේ විනෝදාස්වාදය ලබා දෙමින් මුදල් ඉපයීමටය.

නවකතාකරුවකු සිය චරිත හා ඒ චරිත හැසිරෙන හැටි නිගමනය කරන්නේ ළදරුවකු ක්‍රීඩා කිරීම සඳහා සෙල්ලම් බඩු තෝරා ගන්නා පරිදි යැයි ඇලන් තවදුරටත් කියයි. නවකතාවක් ලියන්නට නවකතාකරුවකු පොලඹවන්නේ පළමුව ඔහුට ඉන් ලැබෙන තෘප්තිය නිසාය. එසේ වෙතත් ඕනෑම නවකතාකරුවකු හමුවේ ඇති අප්‍රමාණ වූ මිනිස් වර්ගයන් ද ඔවුන් ගේ අන්‍යොන්‍ය සම්බන්ධතා ද අවට සමාජය කෙරෙහි ඔවුන් දක්වන ආකල්පයන් ද අතරින් අති ශ්‍රේෂ්ඨ නවකතාකරුවකුගේ කෘතියකට වුවද ඇතුළත් වන්නේ අල්ප මාත්‍රයකි. එය එසේ වනුයේ සිය අමුද්‍රව්‍ය තෝරා ගැනීමට නවකතාකරුවාට ඇති නිදහස සීමා සහිත වූවක් වන බැවිනි. එය ඔහුගේ පෞරුෂය විසින් නිගමනය කරනු ලබන තෝරා ගැනීමකි.

මේ අනුව සලකා බලන විට ගුණදාස අමරසේකර ගේ රූපාන්තරණය හෙවත් සෝමදේවගේ සංක්‍රාන්තිය, ශාන්ති දිසානායකගේ පරඬැල් හා ඇරැව්වල නන්දිමිත්‍රගේ ගිනිසාය වස්තු විෂය අතින් ද සංදර්භය හා ආඛ්‍යානය අතින් ද එකිනෙකට බොහෝදුර වෙනස්ය. ම විසින් ඉහත ඡේදයේ සඳහන් කරන ලද කරුණු ඒ වෙනස සනාථ කරයි.




ගුණදාස අමරසේකර ගේ රූපාන්තරණය සැලකිය යුත්තේ නවකතාවක් ලෙස නොව කෙටි නවකතාවක් (Novella) ලෙසය. ජෝසප් කොන්රඩ් නම් නවකතාකරුවා ගේ Heart of Darkness නම් කෘතිය කෙටි නවකතාවකට දිය හැකි මාහැඟි නිදර්ශනයක් ලෙස සලකනු ලැබේ. එය පළවුයේ අපේ පළමුවන නවකතාව පළවීමට වසර 3 කට පමණ පෙර 1902 දීය. කෙටි නවකතාව ජර්මන් ප්‍රභවය ඇත්තකි. ඇත්ත වශයෙන්ම කෙටි නවකතාව පිළිබඳ විචාර මත හා නිර්ණායකයන් බොහෝදුරට පදනම් වන්නේ ජර්මන් සාහිත්‍ය සම්ප්‍රදාය මතය.

කෙටි නවකතාවක මුඛ්‍ය වශයෙන්ම ඇත්තේ සංකේතයන් හෝ සංකේත කිහිපයක එකතුවකි. ඇත්ත වශයෙන්ම කෙටි නවකතාවකට ගැඹුරක් හා වැදගත්කමක් ලබා දෙනුයේ නවකතාකරු භාවිත කරන සංකේත රූප විසින් මිස එහි වස්තු වින්‍යාසය විසින් නොවේ.

අමරසේකර සිය කෘතිය හඳුන්වා දෙන්නේ "ප්‍රහසනයක මුහුණුවර ගත් නිර්මාණයක්" ලෙසය. ඊට ඇතුළත් වන්නේ පසුගිය අඩ සියවස තුළ මෙරට සමාජයෙහි දෘෂ්‍යමාන වූ දෙස් විදෙස් සමාජ, දේශපාලන, සංස්කෘතික බලවේග පිළිබඳ කතාන්දරයයි. ඒ කතාන්දරය කරලියට එනුයේ ප්‍රධාන චරිතය වන සෝමදේව අත් විඳි රූපාන්තරණය (metamorphosis) මගිනුයි.

අමරසේකර ගේ නවකතාව සිය මෑත කාලීන කෘති මෙන්ම නවකතා ක්ෂේත්‍රයේ දිගන්තය පුළුල් කරන බව කිව යුතුය. ප්‍රහසනය පුද්ගලයින්ගේ හෝ පුද්ගල කණ්ඩායම්වල හෝ දුබලතාවලට පහරදීමට යොදා ගැනේ. එහි ප්‍රධානම මෙවලම් වනුයේ පරිහාසය, අතිශයෝක්තිය හා අවඥාවයි. එහෙත් අමරසේකර ගේ රූපාන්තරණය නියම වශයෙන්ම ප්‍රහසනයක් නොවේ. මීට කලකට පෙර කෙටි කතා ලියූ ටී.ජී.ඩබ්ලිව්. ද සිල්වා ගේ කෘති ප්‍රහසන ලෙස ඉදුරාම හඳුන්වා දීමට පුළුවන. එහෙත් රූපාන්තරණය ඒවාට හාත්පසින්ම වෙනස්ය. අමරසේකර ගේ කෘතිය සමාජයීය - සංස්කෘතික (Socio-Cultural) කෙටි නවකතාවක් ලෙස හඳුන්වා දීමට කැමැත්තෙමි. එය මුඛ්‍ය වශයෙන්ම මෙරට සමාජයේ හා සංස්කෘතියේ සිදු වූ ප්‍රයාම කෙරෙහි අපගේ අවධානය යොමු කරවයි.

අතිකූත් විෂයයන්ට හෝ තේමාවන්ට වඩා මෙබඳු නවකතාවක් රචනා කිරීමේ දී නවකතාකරු ගැටලු රාශියකට මුහුණ දේ. එනම් එබඳු නවකතාවකදී කතුවරයා ගේ දෘෂ්ඨි කෝණය ඉස්මතුව පෙනේ. ඔහු නියත වශයෙන්ම අර්ථකතනයක් කරයි. එහිදී එය අති විශේෂ පෞද්ගලික අර්ථකතනයක් වීමේ අනතුරට ලිස්සා යාමට කතුවරයාට ඇති ඉඩකඩ බොහෝය.

අමරසේකර ගේ කෙටි නවකතාවේ එබඳු ලක්ෂණ මම නොදුටිමි. ඔහු මෑත යුගයේ

සිදුවූ ප්‍රයාම කෙරෙහි අපගේ අවධානය යොමු කරවයි. එහිදී ජනවාර්ගික අර්බුදය, ජාතිකත්වය, රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිත්වය හා ඒවාට පසුබිම් වූ බුද්ධිමය සංවාද හා කූට උපක්‍රම ද අපට පැහැදිලිව විද්‍යමාන වේ. මනුෂය ජීවිතයේ ස්වභාවය අනුව භෞතික වූත් උන්නතිකාමී වූත් බලවේගවලට හසු වුවද මිනිසා උරුම කර ගන්නා සංස්කෘතිය විසින් දායාද කරන හෘදය සාක්ෂිය නැතහොත් කුසලාකුසල විඥානය අවසානයේ දී ඔහුගේ ආරක්ෂාවට සිටින බව රූපාන්තරණය නම් කෙටි නවකතාවෙන් ගම්‍ය වේ.

සෝමදේව හීනයැයි සම්මත කුලයක ඉපිද අමාරුවෙන් ඉගෙනගෙන සිය උත්සාහයෙන් ජීවිතය සාර්ථක කර ගන්නා චරිතයකි. ඔහු ලංකාවේ විශ්ව විද්‍යාවල පමණක් නොව විදේශීය විශ්වවිද්‍යාලවල පවා උගනී. එසේ කිරීම සඳහා ඔහුට සමාජයේ ඉහළ ස්ථරයක මිනිසුන්ගේ උපකාරය ලැබේ. ශූර බුද්ධිමතකු වූ සෝමදේවගේ සියලු කුසලතාවන් අර සමාජ ස්ථරය විසින් සිය අපේක්ෂාව මුදුන් පමුණුවා ගැනීමට භාවිත කරණු ලැබේ. සෝමදේව මෙහිදී නොදැනුවත්වම ඒ උපක්‍රමයට ගොදුරු වේ. එසේ වුවද කාලය ඉක්මයත්ම තමා උගුලක හසු වී සිටින බව සෝමදේව අවබෝධ කරගනී.

ඩොලර් ඉපයීමේ මුඛ්‍ය පරමාර්ථය ඇතිව රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙරට විසුරුවා හරින ලද මතයකට සෝමදේව නොදැනුවත්වම රුකුල් දෙයි. එනම් බුදුසමය හා සිංහල ජාතියේ පුනර්ජීවනය ගැන කතා කිරීම ජනවාර්ගික අර්බුදය විසඳීමට ඉමහත් බාධාවක් වන බවය. අවසානයේ දී එය එසේ නොවන බව සෝමදේව වටහා ගනී. ඔහුගේ රූපාන්තරණය මෙයයි.

අමරසේකර මේ මතවාදය කලාත්මක කෘතියකට නඟයි. එහිදී ඔහු යොදා ගන්නා කලා ප්‍රයෝග කෘතියේ මුඛ්‍ය තේමාවට අතිශයින්ම ගැලපේ. අප පිළිගත්තත් නැතත් දේශපාලනික හෝ සමාජයීය මතවාද සාකච්ඡා කිරීමේ අයිතිය නවකතාකරුවකුට තිබේ. අප එබඳු නවකතාවක් විනිශ්චය කළ යුත්තේ එහි ඇති මතවාදයේ සත්‍යාසත්‍යතාවය අනුව නොව නවකතාකරු සිය කලා ප්‍රයෝග මඟින් එනම් චරිත, සිද්ධි, අවස්ථා, මිනිස් සබඳතා මඟින් තම ප්‍රයත්නය කෙතෙක් දුර සනාථ කර ඇද්ද යන්න ඇසුරිනි. ඒ අතින් බලන කල රූපාන්තරණය වර්තමාන සමාජයට අදාල මාතෘකාවක් සාකච්ඡා කරන සාර්ථක කෘතියක් ලෙස සලකමි.

ශාන්ති දිසානායකගේ පරඬැල් නම් නවකතාව උතුරු මැද පළාතේ කොලනි ගමක මිනිසුන්ගේ ජීවිතය නිරූපනය කරන්නට ගත් උත්සාහයකි. ශාන්ති දිසානායක බස හොඳින් හසුරුවයි. දෙබස්වලදී අදාල සමාජයේ බස් වහර මනාව උපයෝගී කර ගනී. එහෙත් ලීලාරත්නගේ චරිතය නිර්මාණය කිරීමේදී ඇතැම් අවස්ථාවල කතුවරිය සංවේගාතිශය නිරූපණයක යෙදෙයි. එය නොමනාය.



මේ කොලනියේ ලීලාරත්න විශේෂ චරිතයක් වේ. පළමුව ඔහු බාහිර වශයෙන් ඡවි වර්ණයෙන් ද අන් අයට වඩා වෙනස් වෙයි. ඔහු අවට සියලු දෙනා සිය ජීවිත ප්‍රායෝගිකව සාර්ථක කර ගැනීමට උත්සාහ කරන අතර ලීලාරත්න පුරුදු පරිදි පියාගෙන් උරුම වූ කුඹුරු වැඩ කරමින් ජීවත්වීමට උත්සාහ දරයි. ඔහු සිය මවට හා පියාට ද සහෝදර සහෝදරියන්ට ද හිතවත්ව කටයුතු කරයි. එසේ කටයුතු කිරීමේදී ඔහු මමත්වය මුලිනුපුටා දැමූවකු ලෙස ද ඇතැම් විට හැසිරේ.

ලීලාරත්න ගේ ඒ ජීවිතය සුණු විසුණු වී යන්නේ ඔහු හා රමණී නම් තරුණියක අතර ඇතිවන සම්බන්ධය නිසයි. තරුණිය සුදු කබර රෝගයෙන් පෙළෙන එකියකි. එක් දිනක් ඇය හා එක්වන්නට ගත් උත්සාහයකදී තමා නෂ්ටකාමයෙන් පෙළෙන්නෙකු බව ලීලාරත්න අවබෝධ කරගනී. ඒ අවබෝධය ඔහුගේ ජීවන රටාව වෙනස් කරලීමට සමත් වෙයි. ඔහුගේ නෂ්ටකාමයත් රමණී ගේ සුදු කබර රෝගයත් ජීවිතය පිළිබඳ අපේ විශ්වාස හා අපේක්ෂා දෙදරුම් කැවීමට තරම් ප්‍රබල සංකේත වේ. එමෙන්ම නවකතාව පුරාම ලීලාරත්න ගේ නිවස ඉදිරිපස අඳුරේ පිහිටි දැවැන්ත නුග ගසේ නුග අරටු වෙත කතුවරිය අප කැඳවාගෙන යයි. එය ඔවුන්ගේ ජීවිතය පුරා විසිරීගිය දැවැන්ත ව්‍යසනයක සංකේතයක් වෙයි.

ලීලාරත්න සිය නෂ්ටකාමය වටහාගත් මොහොතේ සිට ශාරීරික මෙන්ම මානසික බෙලහීනයෙක් ද වෙයි. එහෙත් ඔහු දේවාරූඪව අනාවැකි කියන්නට යයි. ඔහුගේ ජීවිතය ඒ දේවාලය තුළ කොටු වෙයි.

මා කලින් කීවාක් මෙන් බස හැසිරවීම අතින්ද අවස්ථා සහ සිද්ධි නිරූපණය අතින් ද කුසලතාවක් දක්වන කතුවරිය සිය නවකතාව අවසන් කරන්නේ මට හිතෙන හැටියට අද්භූත ප්‍රයෝගයක් මඟිනි. එය කෙතෙක් දුරට පාඨක සිත් ඇද බැඳ ගැනීමට සමත්වේ දැයි නොදනිමි.

ඇරැව්වල නන්දිමිත්‍රගේ ගිනිසාය දෘෂ්ටාන්තයක ලක්ෂණ ඇති නවකතාවක් ලෙස සලකමි. මුළු පළාතක් ව්‍යසනයට පත් කරමින් නියං සායක් පැතිරෙයි. ඒ නියං සාය ඉදිරියේ පළාතේ ජනීජනයා අන්ත අසරණ තත්ත්වයට පත්වෙති. ඔවුන්ට ඇති එකම විකල්පය නියං සාය ප්‍රබලව නොපැවති අන් පළාතකට සංක්‍රමණය වීමයි.

අභය හා තාරාත් සිය පවුලේ අය සමඟ ඒ දුෂ්කර ගමන පටන් ගනිති. අතරමඟදී ඔවුන්ට නොයෙක් දුක් පීඩා වලට භාජනය වීමට සිදුවේ. වරක් ඔවුන්ගේ ගැල බැඳි ගවයා සොරුන් ගෙන යනු ලැබේ. ඉන්පසුව ගැල මග දමා බඩු මුට්ටු කරේ තබාගෙන ගමන ආරම්භ කරති. දුර්භික්ෂයක් නැති නැගෙනහිර ප්‍රාන්තයට ඔවුහු අවසානයේ ළඟා වෙති.

අභයගේ පුත්‍ර සේල ගේ පෙම්වතිය වූ චාපා ද මේ ගමනට එක්වේ. නැගෙනහිර ප්‍රාන්තයේදී යුවරජු චාපා සිය වසඟයට ගනී. අභය ගේ පවුලට එමගින් යම් පිහිටක් යුවරජු ගෙන් ලැබුන ද ඔවුන් ගේ අභ්‍යන්තර ජීවිතය මේ නිසා විනාශ වේ.

ගිනිසාය දෘෂ්ටාන්තයක ලක්ෂණ ඇති නවකතාවක් යැයි මම මුලින් කීවෙමි. ගිනිසාය, සංක්‍රමණය, බලවතුන් ගේ ග්‍රහණයට හසුවීම යුවරජු සිය උපක්‍රම මඟින් චාපා වසඟයට ගැනීම යන සියල්ල වර්තමාන සමාජය තුළ දැකිය හැකි ලක්ෂණ වෙයි. මේ කතාව මට සිහිපත් කළේ ෆ්‍රාන්ස් කෆ්කා ගේ The Bucket Rider නම් කෙටි කතාවයි. පෞද්ගලික හෝ පොදු කිසිවක් අරබයා ස්ථිර විශ්වාසයක් තබාගත නොහැකි ලෝකයක මනස්තාපය හා ඉච්ඡාභංගත්වය අපේක්ෂා කළ යුතුය.

The Bucket Rider කෙටි කතාවේ තේමාව මෙයයි. සීතලෙන් මිදීමට ගිණිමැලයක් ගසා ගැනීම සඳහා පුද්ගලයෙක් රට අඟුරු වෙළෙන්දා වෙත යයි. සිය බාල්දියට නගින

ඔහු අඟුරු වෙළෙන්දා ළඟට යන්නේ අහසිනි. එසේ ගොස් අඟුරු ඉල්ලුව ද වෙළෙන්දා ගේ බිරිඳ ඊට මැදිහත් වේ. කිසිවකු අඟුරු නොඉල්ලූ බවද සැමියා සිහිනයක් දුටු බව ද බිරිඳ ඔහුට කියයි. අසරණ මිනිසා අඟුරු ඉල්ලනු ඇයට ඇසෙන නමුත් "මෙහි ඇති අඟුරක් නැතැයි" පවසන ඇය ඔහු පලවා හරී.

සංකේත රූප ද අධිතාත්වික හා සාංදෘෂ්ටික කලා ප්‍රයෝග ද යොදාගෙන රචිත මේ කෙටි කතාවෙන් කෆ්කා නිරූපනය කරන්නේ මිනිසා ගේ අන්ත අසරණ භාවයයි. ගිනිසාය එබඳු නවකතාවක් වෙයි. කර කියාගත දෙයක් නොමැතිව රුවලින් තොර ඔරුවක් ලෙස දියෙහි ඒ මේ අත පාවෙන මිනිස් ජීවිත අරබයා කරන ලද හොඳ විවරණයක් ලෙස මම ඇරැව්වල නන්දිමිත්‍ර ගේ ගිනිසාය නම් නවකතාව දකිමි.

ථෙරී ගාථා ද බෞද්ධ සාහිත්‍ය සම්ප්‍රදායද සරල සුගම භාෂා ශෛලියක් ද මගින් නන්දමිත්‍ර අප සිත් ඇද බැඳ ගනී.

ටෙනිසන් පෙරේරාගේ අබිරහස් ජීවිත තරණය නව ආඛ්‍යාන රීතියකින් ලියන ලද නවකතාවකි. එය මෑත යුගයේ මෙරට සිදු වූ 'විමුක්ති සටන්' පසුබිම් කොට ලියන ලද්දකි. එහෙත් මෙම නවකතාවේ මුඛ්‍ය තේමාව වශයෙන් සැලකිය යුත්තේ එම විමුක්ති සටන නොව එය පදනම් කොට ගෙන වුවද ඉන් පරිබාහිරව ගොඩ නැගුණු සිද්ධි සමූහයකි. නවකතාවේ 'පෙර සඳහන' ඒ පිළිබඳ ඉඟියක් දෙයි. එහිදී විලියම් ශේක්ස්පියර් ගේ හැම්ලට් නාට්‍යයෙන් කතුවරයා පද කිහිපයක් උපුටා දක්වයි. "සිදුවේද නොවේද, එය තමා ප්‍රශ්නය/, වේදනා විඳින හදවත උදාර වේද?/, කුරිරු ඉරණමෙහි හී සර බාර ගන්නවාද? එසේත් නැත්නම් සාගරයක් බඳු දුක් කම්කටොළු හිරිහැරවලට එරෙහිව අවි අමෝරනවාද?/, මේ හැමට විරුද්ධව ඒවා නසා දමනවාද ?"

විමුක්ති සටනෙහි ප්‍රධාන භූමිකාවක් කරන රම්‍යලතා රජයේ බල පුලුවන්කාර මන්ත්‍රීවරයෙකුගේ වසඟයට පත්වේ. ඇය ඔහුගේ මන්දිරයේ ඔහු සමඟ ජීවත් වෙමින් සිය පළිගැනීමේ චේතනාව කිසිවකුට නොදැනෙන්නට ක්‍රියාවට නඟයි. මෙහිදී කතුවරයා වර්තමාන සමාජයේ ඉහවහා ගිය දූෂණ හා අකටයුතු අප ඉදිරියේ අනාවරණය කරන්නට උත්සාහ දරයි.

ටෙනිසන් පෙරේරා වර්තමාන නවකතාකරුවන් අතර නවකතා සන්දර්භය හා ආඛ්‍යාන රීතිය වෙනස් කිරීමට උත්සාහ ගන්නා ලේඛකයෙකි. මේ නවකතාව මඟින් ඔහු සිය උත්සාහයන් තවදුරටත් කරගෙන යයි. ඉන්ද්‍රජාලික යථාර්ථවාදී ප්‍රයෝග මෙහිදී කතුවරයා යොදාගෙන ඇත. එහෙත් නවකතාවේ මුල් භාගයේ දී ඔහු අනුගමනය කරන ආඛ්‍යාන රීතිය පාඨකයා වෙහෙසට පත් කරවන බවත් මට දැනිණ. නවකතාවේ දෙවන භාගයේදී අනාවරණය කරන සිද්ධි දාමය ද ආඛ්‍යාන රීතිය ද පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී.

පසුගිය දශක කිහිපය තුළ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ දූෂණ, කෲරකම්, මනුෂ්‍ය ඝාතන, පැහැර ගැනීම්, ස්ත්‍රී දූෂණ, සුරා දූර්ත දේශපාලකයින් පිළිබඳ තොරතුරු මෙම නවකතාවේ මුඛ්‍ය තේමාවෙහි අන්තර්ගතය. මේ සියල්ල මෙරට පාඨකයාට අමුතු දෙයක් නොවන අතර අබිරහස් ජීවිත තරණය නම් නවකතාව විසින් එකී සිද්ධිදාමය කලාත්මක ස්වරූපයෙන් අපේ සිත් තුළ බහාලයි. අබිරහස් ජීවිත තරණය නවකතාවේ මා දකින සුවිශේෂත්වය එයයි.

යථෝක්ත සිද්ධි දාමය මුල් කරගෙන කතාවක් ලියන්නට ලේඛකයෙකුට පුළුවන. එහෙත් ටෙනිසන් පෙරේරා බොහෝ කාලයක් පුහුණු කරන ලද සිය කලා කුසලතාව මඟින් රමණීය නවකතාවක් ගොතන්නට සමත් වෙයි.




අබිරහස් ජීවිත තරණය නම් මෙම නවකතාවේ තව ද එක් විශේෂයක් මම දකිමි. එනම් යුරෝපියානු නවකතාව ඔස්සේ ද විශේෂයෙන්ම ලතින් ඇමරිකානු නවකතාව ඔස්සේ ද ලොව පුරා පැතිර ගිය ඉන්ද්‍රජාලික යථාර්ථවාදී ප්‍රයෝග හා අධිතාත්වික කලා ප්‍රයෝග සිංහල නවකතාවකට උචිත ලෙස යොදා ගැනීමයි. මේ නවකතාව කලාත්මක නිර්මාණයක් වන්නේ ඒ ප්‍රයෝග ආශ්‍රයෙන් නවකතාකරු නිර්මාණය කරන ලෝකය නිසාය.

රම්‍යලතා තුළ ඇති පළිගැනීමේ චේතනාව අඩියෙන් අඩියට ඉදිරියට යන හැටි ටෙනිසන් පෙරේරා වර්ණනා කරන්නේ සියුම් වූ ද නිරීක්ෂණශීලී වූ ද දෘෂ්ටිකෝණයක් මඟිනි. මිනිස් සිත් සතන් හි සැඟවී සිටින එම ආවේග පාඨක සිත් ඇද බැඳ ගැනීමට ප්‍රමාණවත් තරමින් වර්ණනා කිරීම ශූර නවකතාකරුවකුට පමණක් කළ හැකි දෙයකි. ටෙනිසන් පෙරේරා එම කාර්යය මනාව ඉටු කරයි.

වර්තමාන සමාජයේ සාමූහික විඥානය පිළිබඳ කෙරෙන විග්‍රහයක් ලෙස පූජ්‍ය බටුවන්ගල රාහුල හිමියන් ගේ නයි ගලින් උපන් පුත්‍රයෝ නම් නවකතාව හඳුන්වාදිය හැකිය. පොදු සමාජයේ ආධාර උපකාර ලබා ගැනීමට නම් ඔවුන්ගේ බුද්ධියට නොව හදවතට කතා කළ යුතු බව කපටි ව්‍යාපාරිකයා මෙන්ම දේශපාලනඥයාද දනියි. විශේෂයෙන් වර්තමාන සමාජය මෙහෙයවනු ලබන්නේ ඒ සාමූහික විඥානය විසිනි.

නවකතාව ආරම්භයේදී මුනින්තලාව බිම වැටුණු බුදු පිළිමයක් ගැන අපගේ අවධානය යොමු වේ. එය ප්‍රබල සංකේතයක් යැයි සිතමි. එහෙත් නවකතාවක සංකේත භාවිතයේදී එය එක් අර්ථයක් සඳහාම යොදා ඇතැයි නිශ්චය වශයෙන් කිව නොහැක. ඇත්ත වශයෙන් ම සංකේතයක බලය රඳා පවතිනුයේ ඉන් නොයෙකුත් අදහස් අඟවන නිසාය. එහෙත් මෙහිදී නාගවීර හා නාගජීව යන දරුවන් උපන් අවස්ථාවේදී එය ඇද වැටීමෙන් නිරූපණය වන්නේ එක් සමාජයීය සිතුවිලි පරම්පරාවක අවසානය බව අනුමාන කළ හැකිය.

නාගජීව හා නාගවීර යන නිවුන් දරුවන් දෙදෙනා එකිනෙකාට හාත්පසින්ම වෙනස් ජීවන මාර්ග අනුගමනය කරත්. නාගජීව සූක්ෂ්ම ලෙස සිය ජීවිතය භෞතික වශයෙන් සාර්ථක කර ගන්නේ ඉහත කී සාමූහික චින්තනයේ අබල දුබලකම් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගනිමිනි. ඔහුගේ සොහොයුරා වන අවංක හා නිරවුල් මනසක් ඇත්තා වූ නාගවීර ජීවනෝපාය වශයෙන් තෝරාගන්නේ ත්‍රීවීලර් රථයක් පැදවීමය. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු වශයෙන් සේවය කරන නාගජීව ජනමාධ්‍ය උපයෝගී කරගෙන සාමූහික සමාජ විඥානය ඒ මේ අතට නටවන සූර විජ්ජාකාරයෙක් වෙයි. ඔහු සිය ශිෂ්‍යාවක වන දිනිතිට මෙසේ කියයි. “ජනමාධ්‍ය කියන්නේ පිපාසයෙන් ඉන්න මිනිස්සුන්ට ජලය බෙදාහරින පයිප්ප ලයින් එකක්. ඒ පයිප්ප ලයින් එකේ ඕනම දෙයක් එවන්න පුළුවන්. පිපාසයෙන් ඉන්න මිනිසුන්ව මත් කරලා නිදි කරවන නිෂ්පාදන තමයි දැන් වැඩිහරියක් මේ

ලයින් එකේ යන්නේ....... ඒවා බීලා මිනිස්සු තැන තැන්වල වැටිලා නිදාගන්නවා. හොරු ඒ නින්දේ ඉන්න මිනිසුන් ගේ ඇඟට උඩින් පැනලා ගිහිල්ලා ඕන දේවල් අරගෙන යනවා"

නාගජීව ඇත්ත වශයෙන්ම පුද්ගල බේදවාචකයන් හා සමාජ බේදවාචකයන් විකුණාගෙන කන අමනයෙක් වෙයි. ඒ ලෝකයේ ගැවසෙන්නේ මිනිස් රූකඩය. හොඳ නරක පිළිබඳ විනිශ්චයක් එහි නැත. ඇත්තේ කණපිට පෙරළවාගත් විනිශ්චයකි.

මේ නවකතාව වර්තමාන සාමූහික චින්තනයේ හිස් බව ප්‍රකට කරන ලේඛනයක් වෙයි. මිනිසා මූලික වශයෙන්ම හැඟීම් හා ආවේගයන් විසින් පාලනය කරනු ලබන්නෙක් වෙයි. එය හැඳින ගන්නා කුඨ දේශපාලනඥයා මෙන්ම සමාජ ප්‍රභුවරුද සිය අභිමතාර්ථ සපුරා ගැනීමට එය අනගි මගක් කර ගනිති.

පූජ්‍ය බටුවන්ගල රාහුල හිමියන් මේ කතාව කියන්නට තෝරාගත් පසුබිමද ඉතා හොඳින් ගැලපේයැයි සිතමි. එය ආගම් භක්තියෙන් මෙන්ම දේව භක්තියෙන් ද හැඩ ගස්වන ලද සමාජයකි. ඔවුහු මිථ්‍යා මතවල එල්බෙති. එම සමාජයේ පන්සල, බුදුරුව, බෝධි වෘක්ෂය මිනිසුන් භක්තියෙන් වැළඳ ගන්නා අවයව වෙයි. බුද්ධියට හා විචක්ෂණභාවයට එහි ඇත්තේ සීමිත ඉඩකඩකි.

නයි ගලින් උපන් පුත්‍රයෝ කාලීන තේමාවක් රැගත් කෘතියක් මෙන්ම නවකතාවේ විෂය ක්ෂේත්‍රය පුළුල් කරන කෘතියක් ද වේ.

බොරිස් පැස්ටර්නැක් නම් ශ්‍රේෂ්ඨ නවකතාකරුවා ගේ කියුමක් මට මෙහිදී සිහි වේ. "වඩාත් වැදගත් වන්නේ ඓතිහාසික නිරවද්‍යතාව නොව යුගයක ස්වරූපය යළිත් නිර්මාණය කිරීමයි. වඩාත් වැදගත් වන්නේ විස්තර කරන අවස්ථාව නොව දුර කාමරයක සිට වැටෙන එළියකින් මෙන් එම අවස්ථාව ආලෝකමත් කිරීමයි."

සමාජ ප්‍රගමනය හා යථා හා අයථා පැවැත්ම පිළිබඳව ලියනලද නවකතාවක් වශයෙන් කරුණාදාස සූරියආරච්චිගේ රතු ඉද්ද හඳුන්වා දිය හැකිය. විකෘතිය හා ප්‍රකෘතිය අතරින් දිවෙන මායිම් දිගේ ගමන් කරන ලෙස කතුවරයා අපෙන් ඉල්ලයි. සඳවතී සහ ඉන්දුලතා යන දෙසොහොයුරියන් ගේ චරිත ලක්ෂණ මෙහිදී අපේ අවධානයට යොමු වේ. සඳවතී ජීවිතය එන සැටියෙන් බාරගනී. ඇය ඒ සමඟ පොරබදන්නට හෝ ඊට එරෙහිවන්නට හෝ නොයයි. එය ඇගේ දුබල කමක් නොව චිත්තාභ්‍යන්තර ධෛර්යයෙහි පිළිබිඹුවක් බව අපට පෙනේ. ඇය සිය වටාපිටාවේ ගස්වැල් සමග කතා කරයි. එය පාඨක හද සසල කරන සම්භාෂණයක් වේ. මන්ද යත්, ඇය සිය ජීවිතය පුරාවට දිවෙන දුක හා සැප බෙදා හදා ගන්නේ අචේතනිකයයි අප සිතන ගස්වැල් සමඟය. එහෙත් සඳවතීට ඒවා සහෘදයෝ වෙති.

ඉන්දුමතී ඊට මුළුමනින්ම වෙනස් චරිතාංගයකින් හෙබි යුවතියකි. ඇය සාම්ප්‍රදායික සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස යනාදිය මහත් කොට නොසලකයි.






"දෙයියන්ට බුදුන්ට කැප වෙච්චි මල් ගහක් දෙකක් මිදුලක තියෙන්ට ඕනෑ කියලා මං අප්පච්චිට කිව්වා."

අම්මා ඔය කතාව කියන්නට ගොස් දිනක් චූටි නංගි සමඟ රණ්ඩුවකද පැටලුණාය.

"අම්මේ ගස්වල මල් හැදෙන්නේ පූජා කොරන්ඩම නෙමේ. ඒ ගහේ ඊලඟ පරම්පරාව හදාගන්ඩ"

ඉන්දුලතා අම්මා එක්ක කතාවට පැටලුණාය. ඒ වනවිට ඈ හිටියේ අටවැනි පන්තියේය.

"කිසිම දේක වැදගත්කමක් දකින්නැති එකියක්. මොන ජම්මෙකට හැදෙනවද කියලා හිතාගන්ඩ බෑ...."

යථෝක්ත නිරූපණයෙන් අපට පෙනී යන්නේ ඇගේ සිත වැඩ කරන දිසාවයි.

ඇය සිය ජීවිතයේ ඉදිරි මග සකසා ගන්නේ ඇයට සමීප අන් කිසිවෙකුත් මායිම් නොකරය. විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා රාජ්‍ය නොවන සංවිධානයක සේවය කරන ඇය සරුව පිත්තල ලෝකයකට පිවිසෙයි. ඒ ලෝකය මෙහෙයවනු ලබන්නේ පාරම්පරිකව අත්හදා බලා සාර්ථකභාවයට පත් පුරුෂාර්ථ විසින් නොව මුදලට හා යසසට ඇති තණ්හාව විසිනි. විශාල ගමන් යන ඇය සිය කන්‍යාභාවය මෙන්ම සිය ආධ්‍යාත්මයද විනාශ කර ගනී. ඇය ආපසු ගමට එන්නේ ඒ යථාර්ථය වටහා ගෙනය. එහෙත් ඒ අවබෝධය ලබා ගැනීමට ඇය සිය ජීවිතයෙන් ගෙවන වන්දිය සුළුපටු නොවේ. අවසානයේ ඇගේ ජීවිතය පුරා විහිදී යන්නේ සොහොයුරිය වන සඳවතීගේ දයා සෙනෙහසයි.

සිංහල නවකතාවට නුහුරු ස්වීය වූ ආඛ්‍යාන රීතියක් සූරියආරච්චි අනුගමනය කරයි. ඒ ආඛ්‍යාන රීතිය වස්තු විෂයට මනාව ගැලපේයැයි සිතමි.

සාමාන්‍ය ගැමියන්ගේ ජීවන රටාව හා සිතුම් පැතුම් පමණක් නොව සමාජයේ ඉහළ ස්ථරයක ආටෝප ජීවිත ගත කරන්නන්ගේ ජීවන ක්‍රමය ද කතුවරයා නිරූපණය කරයි. ඇත්ත වශයෙන්ම සඳවතී ගේ අභ්‍යන්තර ජීවිතය පොදු ජනයාට නොවැටහේ. ඒ ආධ්‍යාත්මය වූ කලී පාරම්පරික ගුණධර්ම විසින් ද සනාතන ධර්මතා විසින් ද මෙහෙයවන සරල සුන්දර ආධ්‍යාත්මයකි. කතුවරයා පාඨක මනස එදෙසට පැහැදිලිව යොමු කරයි.

නවතම තේමාවක් ද නවතම ආඛ්‍යාන රීතියක් ද අනුගමනය කරමින් ලියන ලද රතු ඉද්ද මැතක පළවූ සාර්ථක කෘතියක් ලෙස දකිමි.

කපිල කුමාර කාලිංගගේ පියැසි කවුළුව නම් නවකතාවෙන් පිළිබිඹු වන්නේ සාම්ප්‍රදායික ඉහළ පෙළ මධ්‍යම පාන්තික පවුලක ගරා වැටීමයි. 20 වන සියවසේ මුල් භාගයේ සිට අග භාගය දක්වා කතාව විහිදී යයි. එක් සමාජ ස්ථරයක ජීවන රටාව මැනවින් පිළිබිඹු කර ඇත.

ජොෂ්ය වින්ටර් උන්නතිකාමයෙන් පෙළෙන්නෙකි. ඔහුගේ ආශාව රජයේ කොන්ත්‍රාත් මඟින් මුදල් ඉපයීමයි. එහෙත් තම පවුල ගමන් කරන්නේ අනතුරදායක ප්‍රපාතයකට බව වින්ටර් මහත්මියට හැඟෙයි. සිය පරම්පරාවේ උදවියට මුදල් හදල් ගැන කරදරවීමේ අවශ්‍යතාවයක් නොතිබුණ ද දැන් තත්ත්වය කෙමෙන් වෙනස් වන බව ඇය දනී.

වින්ටර් මුදල් හදල් සෙවීමේ පරමාර්-ථයෙන්ම වෙහෙසෙයි. වරක් සිය සේවකයන් සමඟ සිය නිවෙස වෙත සාදයකට පැමිණෙන ඔහු එය අවසන් වීමෙන් පසුව ආ පිරිස සමඟ ආපසු යන්නට සූදානම් වෙයි.

"අද ඉඳලා ගියා නං නේද හොඳ"

වින්ටර් මහත්මිය සෙමින් ඇසුවාය.

"සැරයක් කිව්වනෙ, හෙට එහෙ ඉන්න ඕනෙ කියලා".

බිරිඳ ගේ මුහුණ අඳුරු වූ බව දුටු වින්ටර් ඇ වෙත ගොස්, පිටට තට්ටු කළේය.

"අපි කොහොම හරි මේ කරදර දවස් ටික පසු කර ගමු. මං ලබන සෙනසුරාදා එනවා"

සාරි පොටින් නෙත් පිසගෙන කාමරයෙන් පිටතට ගිය වින්ටර් මහත්මිය, උඩුමහලේ සිටින පුතාට කතා කළාය.

ඉහත කී අවස්ථා වර්ණනාව වින්ටර් ගේ ජීවිතය කැටිකොට දක්වන සිතුවමක් වැන්න. එහෙත් ඒ ගමන අවසානයේ දී මාස කිහිපයක් ගිලන්ව සිටින ජොෂ්ය වින්ටර් "ට්‍රැක්ටර් උණ" රෝගයෙන් මිය යයි. ඒ මිය යාමත් සමග ඔහුගේ සිහින සියල්ල බොඳ වේ. ඉන්පසුව සියල්ල උඩුයටිකුරුව පෙරළෙයි. තමන්ගේ අතවැසියන් ලෙස සිටි අය තමන්ට වඩා හොඳ ජීවන තත්ත්වයන්ට පත්වෙති. කුඨ ප්‍රයෝගකාරයන් අතර අසරණ (කනිෂ්ඨ) වින්ටර් තනිවේ. ඔහුට සිදුවන්නේ පියැසි කවුළුවෙන් අවට ලෝකය දෙස බැලීමයි. එහෙත් සිය නිවසේ සේවය කළ බණ්ඩයියා සහ රන්සිනා ගේ දයා කරුණාව නිසා ඔහු සහනයක් ලබයි.

මේ නවකතාවේ පරම්පරා කිහිපයක තොරතුරු අප ඉදිරියේ මැවී පෙනේ. එය එක් පවුලක ගරා වැටීමක් ලෙස නොව එක් සමාජ ස්ථරයක ගරා වැටීමක් ලෙස සැලකිය යුතුයැයි සිතමි. අධිතාත්විකවාදී මෙන්ම ඉන්ජාලික කලා ප්‍රයෝග ද උපයෝගී කොට ගෙන කපිල කුමාර කාලිංග සිය නවකතාව රචනා කරයි. පෙම් සබඳතා ද හමුවීම් හා වියෝවීම් ද ඒ හා බැඳුණු දුක්ඛ දෝමනස්සයන් ද අපගේ අවධානයට යොමු වේ. එහෙත් සිය කතා තේමාව ඇතැම් විටක පාලනය කර ගැනීමට කතුවරයා අසමත් වන බව පෙනේ.

පසුගිය කාලයේ එකම රටාකට ගිය නවකතාව ඉන් මුදා ගෙන අලුත් මගකට යොමු කිරීමට කපිල කුමාර කාලිංග ගෙන ඇති උත්සාහය නම් අගය කළ යුතුය.



ඉහත කී නවකතා පොදුවේ සලකා බලන කළ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක්ම තිබේ. වස්තු විෂය, වර්ණනා රීතිය හා බස් වහර අතින් මේ නවකතාකරුවෝ කැපී පෙනෙති. මුළු මනුෂ්‍ය ජීවිතයම නවකතාකරුවාගේ වස්තු විෂයට ගත හැකි වුවද යම් කිසි තේරීමක් කිරීමට සිදු වේ. තෝමස් හාඩි නම් ඉංග්‍රීසි නවකතාකරුවා ගේ කියුමක් මට මෙහිදී සිහිපත් වේ. "මුළු ජීවිතයම බදා වැළඳගන්නා වර්තමාන නවකතාකරුවන් බොහොමයක් කතාවක් වැදගත් විය යුතු බවද ජීවිතයේ බොහෝ කොටසක එබඳු වැදගත් කමක් නැති බවද සාමාන්‍ය මිනිසකු ජීවිතය තුළ දකින දේ පුන පුනා නොකිය යුතු බව ද අමතක කරති."

නවකතාව යනු පුද්ගල අනුභූතියක් යම් කිසි සන්දර්භයක පිහිටා වර්ණනා කිරීමයි. සමාජය මෙන්ම ඊට අනුගාමීව මිනිසා ගේ සිතුම් පැතුම් ද වෙනස් වීම නිසා නවකතාව ද ඒ හා සමානව වෙනස් වෙයි. සමාජය යනු ඒකීභූත අස්ථිත්වයක් නොවේ. ආර්ථිකය, දේශපාලනය, තාක්ෂණයේ දියුණුව යන කරුණු විසින් සමාජය නිරතුරු වෙනස් කරනු ලැබේ.

ඇත්ත වශයෙන් ම නවකතා ව්‍යුහයේ අවිච්ඡින්නතාවක් ඇති බවත් ඒ නිසාම එය යුගයෙන් යුගයට විහිදී යන බවත් මැල්කම් බ්‍රැඩ්බරි නම් විචාරකයා කියයි. මේ අවිච්ඡින්න ව්‍යුහය පමණක් නොව නවකතාවක තිබිය යුතු ගුණාංග ලෙස විශ්වසනීයත්වය හා යථාර්ථය හුවා දැක්වෙයි. එහෙත් බ්‍රැඩ්බරි පෙන්වා දෙන කරුණු දැන් බොහෝදුර වෙනස් වී ඇති බව සැලකිය යුතුය. එනම් සත්‍ය සිද්ධිය හා නිර්මාණය අතර ඇත්තේ ඉතා සියුම් වෙනසකි.

මා ඉහත සඳහන් කළේ නවකතාව පිළිබඳ වර්තමානයේ සැලකිල්ලට භාජනය වන කරුණු කිහිපයකි.



**එඩ්මන්ඩ් ජයසූරිය**

*සාහිත්‍යවේදියෙක්, කලාවිචාරකයෙක් හා පරිවර්තකයෙකි. ග්‍රේෂන් පදනම මෙහෙයවන හොඳම පරිවර්තන කෘතියට හිමි එච්.ඒ. අයි. ගුණතිලක සම්මානයෙන් 2008 දී ද, හොඳම පරිවර්තන කෘතියට හිමි රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් 2004 දී ද පිදුම් ලැබීය.*

## පොරය ජයගත් කුකුළා



කුකුළෝ දෙදෙනෙක් ගොම ගොඩක් මත කොටා ගනිමින් සිටියහ. ටික වෙලාවකට පසු වඩා ශක්තිවන්තයා අනෙකා ගොම ගොඩෙන් එළවා දැමීමට සමත් විය. කිකිළි රංචුව ජයග්‍රාහකයා වටා රැස්ව ජය ගොස පතුරුවන්නට වූහ. එයින් තවත් උදම් වූ කුකුළා ඉගිළ ගොස් වහලයක් මත වසා ආඩම්බරයෙන් හඬලන්නට වූයේය. "බලාපල්ලා... මං තරම් ශක්තිවන්තයෙක් මේ ලෝකෙම නෑ." ඒ මොහොතෙහි ඉහළ අහසේ පියාඹමින් සිටි රාජාලියෙක් පහත් වී කුකුළා සිය නියවලින් ඩැහැගෙන ගියේය.

**- රුසියානු ලේඛක ලියෝ ටෝල්ස්ටෝයි**

# පොත් අලෙවිය සාර්ථක කර ගැනීමට නම්...

සැප්තැම්බර් මාසය යනු ශ්‍රී ලාංකේය පාඨකයින්ගේ සහ ලේඛක-ලේඛිකාවන්ගේ වසත් සමය යි. නිල නාමයෙන් හඳුන්වන්නේ නම් එය සාහිත්‍ය මාසය යි. අනතුරුව එළඹෙන්නේ එහි ම දිගුවක් වූ කියැවීමේ මාසය යි. සාහිත්‍ය මාසය මතු නොව, කියැවීමේ මාසය ද අප පසුකොට ගොස් තවත් වසරක් උදාවී ඇත.

සාහිත්‍ය මාසයේ දී මිල දී ගත් පොත් සියල්ල ඔක්තෝබර් මාසයේ දී නොව, තවත් වසර කීපයක් ඉක්මයන තුරු කියවා හමාර කිරීමට නොහැකි වුව ද 'කියැවීමේ මාසය' නමින් එක් මාසයක් හෝ නම් කිරීම යහපත් ක්‍රියාවකි. එය අගය කළ යුතු ය. නමුදු මහා පරිමාණයේ පොත් ප්‍රකාශකයා ගේ සිට කුඩා පරිමාණයේ පොත් ප්‍රකාශකයා දක්වා වූ ප්‍රකාශකයින්ගේ මුවින් නිරන්තර ගැයෙන දුක් ගීයක් වන්නේ **"දැන් ඉස්සර තරම් පොත් විකිණෙන්නේ නැහැ. දැන් පොත් කියවන පිරිස අඩුවෙලා. පොත් දාහක් විකුණා ගන්නත් හරි අමාරුයි"** යන්න ය. මෙම කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙය සම්පූර්ණ සත්‍යයක් හෝ සම්පූර්ණ අසත්‍යයක් ද නොවන බව ලියුම්කරුගේ අදහස ය. එනම්, පොත් අලෙවිය පහත බැස ඇති ප්‍රමාණයට ම පොත් කියැවීම පහත බැස නොමැත යන්න ය. මේ සඳහා අවැසි උදාහරණ කොතෙකුත් තිබුණ ද අවම මට්ටමකින් හෝ එය විමසා බැලීම මෙම ලිපියේ මුඛ්‍ය අරමුණ ය.

## එතෙර පාඨක ප්‍රජාව

ජපානය, අමෙරිකාව, රුසියාව සහ චීනය වැනි රටවල ජනතාව අතුරින් බස් රථයේ හෝ දුම්රියේ ගමන් කරන මඟීන්ගෙන් සියයට හැටක් පමණ පොත් පත් කියැවීමට හුරු-පුරුදුව සිටිති. මෙරට මඟීන්ගෙන් සියයට දහයක් පමණ ඉහත සඳහන් පුරුද්දට ඇබ්බැහි වී සිටිති. මීට අමතරව දිවයිනේ පිහිටා ඇති මහජන පුස්තකාල විවෘතව තබන කාල සීමාවන් හි ද එහි පාඨකයින් බොහෝ පිරිසක් කියවීමෙහි නිරත වෙති. කොළඹ විහාරමහා දේවී උද්‍යානය, පේරාදෙණිය මල්වත්ත සහ ගාල්ල සමනල පාලම උද්‍යානයේ ද මෙබඳු පාඨක පිරිසක් පොත් කියවීමෙහි නිරත වෙති. මෙයින් අපට පැහැදිළි වන්නේ පෙර සඳහන් කළ පරිදි




පොත් අලෙවිය පහත බැස ඇති ප්‍රමාණයට සාපේක්ෂව කියවන පිරිස අඩුවී නොමැති බව ය.

එසේ නම් අප කළ යුතු වන්නේ 'පොත' නම් වූ පාරිභෝගික භාණ්ඩය 'පාඨකයා' නම් වූ පාරිභෝගිකයා වෙත අලෙවි කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ඇරඹීම ය.

මේ සඳහා රාජ්‍ය තන්ත්‍රයේ මැදිහත්වීම අනිවාර්ය කරුණකි. මේ මොහොතේ ශ්‍රී ලංකාවේ පොත් වෙළෙඳ පොළේ එක් පොතකින් මුද්‍රණය කරන්නේ පිටපත් දහසක් පමණි. (ඇතැම් ප්‍රකාශකයින් මෙය පිටපත් පන්සියය සහ දෙසීය පනහ දක්වා පහත දමා ඇත) එම පිටපත් ප්‍රමාණය අලෙවි කිරීම සඳහා ද මාස හයකට වඩා වැඩි කාලයක් ගතවන බව ද සත්‍යයකි. ඇතැම් පොතක් නිකුත් වී තුන් මසක් තුළ තෙවන මුද්‍රණය ද උත්සවාකාරයෙන් එළිදක්වන බව අපි දුටුවෙමු. මෙම පොත් බහුතරයක් බොළඳ නවකතා විය හැකි ය. එසේ නොමැති නම් එක් එක් චින්තනයන් පෝෂණය කිරීම සඳහා ලියැවුණු පොත්, පරිවර්තිත යොවුන් සාහිත්‍ය පොත් හෝ ඊනියා ධනාත්මක චින්තන පොත් විය හැකි ය. (විෂයානු බද්ධ පොත් මෙම ගණයට අයත් නොවන බව කරුණාවෙන් සලකන්න) නමුත් ඉහළ අගයකින් යුත් හෝ ශාස්ත්‍රීය කෘතීන් අලෙවි කිරීම ඉතා දුෂ්කර කාර්යයකි.

## මිල දී ගැනීමේ ක්‍රමවේදයේ දුබලතා

රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාත්මක වන භාණ්ඩ මිල දී ගැනීමේ ක්‍රියාවලියේ දී ආයතනයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, රථවාහන නඩත්තු කිරීමේ උපකරණ සහ වෙනත් භාණ්ඩ මිල දී ගැනෙනුයේ එම වසර සඳහා අදාළ ආයතනය වෙත වෙන් කළ ප්‍රතිපාදනවලිනි. මෙහි දී නිරන්තරයෙන් අනුගමනය කෙරෙන්නේ අවශ්‍ය බඩු භාණ්ඩවල මිල ගණන් කැඳවා වසරට ම අවශ්‍ය භාණ්ඩ එකවිට මිල දී ගැනීම ය. මෙකී රාජ්‍ය ව්‍යුහය යටතේ පවතින පුස්තකාල සඳහා මුද්‍රිත පොත් මිල දී ගැනීම සඳහා ද මෙම ක්‍රියා පිළිවෙත ම අනුගමනය කරන්නේ නම් එය කෙතරම් ඛේදවාචකයක් ද?

තම ආයතනය වෙත පොත් මිල දී ගැනීම සඳහා ලද මුදලින් එකවිට පොත් මිල දී ගැනීම කිසිසේත් අනුමත කළ හැකි ක්‍රියාමාර්ග යක් නොවේ. ඒ මන්ද යත්, මුළු වසර පුරා ම වරින් වර නව කෘතීන් වෙළෙඳ පොළට නිකුත්වන හෙයිනි. අදාළ ආයතන තමන් වෙත ලද මුදලින් එකවිට පොත් මිල දී ගැනීමේ දී බොහෝ විට එම පොත් අතරින් වසරේ නිකුත් වූ විශිෂ්ට නිර්මාණ මග හැරී යාමට ඉඩ ඇති බැවිනි. එළැඹෙන වසරේ දී ඔවුන් පොත් මිල දී ගැනීමට සූදානම් වන විට ඉහත සඳහන් කළ විශිෂ්ට කෘති වෙළෙඳ පොළෙහි අවසන්ව තිබෙන්නට ඉඩ ඇත. රාජ්‍ය ආයතන වෙත පොත් මිල දී ගැනීම සඳහා මෙබඳු ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ ඇයි? ඒ සඳහා බලපා ඇති ප්‍රධාන හේතුව වන්නේ එම ආයතන ප්‍රධානීන්ට හෝ පුස්තකාලයාධිපතීන් වෙත පොත් ප්‍රකාශකයින් විවිධ ප්‍රතිපාදන ලබා දීමයි. වර්තමානයේ පවතින තවත් විශේෂිත දුර්වලතාවක් නම්, පොත් මිල දී ගැනීම සඳහා වෙළෙඳ පොළ වෙත යන වසරේ මුද්‍රිත පොත් හැර ඉකුත් වසරවල මුද්‍රිත පොත් මිල දී නොගැනීම ය. ඒ සඳහා මෙසේ උදාහරණයක් දැක්විය හැකි ය. අප දන්නා පරිදි රාජ්‍ය ආයතන සඳහා අනුමත මුදල් ප්‍රතිපාදන සැපයෙන්නේ වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල ය. 2013 වසරේ මාර්තු මාසයෙන් ඉක්බිතිව පුස්තකාල සඳහා පොත් මිල දී ගන්නට යන නිලධාරීහු 2012 වසරේ පොත් මිල දී ගැනීම ප්‍රතික්ෂේප කරති. මෙය ඉතාමත් වැරදි ක්‍රියාමාර්ගයකි. මන්ද යත්, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය ඇරඹීමෙන් පසු බහුතරයක් පොත් වෙළෙඳ පොළට එන්නේ සැප්තැම්බර් මස තෙක් පමණි. ඉන් අනතුරුව පොත් නිකුත් වුව ද, ඒ ඉතාමත් අල්ප ප්‍රමාණයක් පමණි. ඉහත ක්‍රමවේදයේ දී අදාළ වසරේ වෙළෙඳ පොළට පැමිණි බහුතරයක් පොත් මිල දී ගැනීම මගහැරෙන බවට මෙය කදිම සාක්ෂියකි.

## දැන් පොත් විකිණෙන හැටි

යම් ප්‍රාදේශීය සභාවක, නගර සභාවක හෝ පළාත් සභාවක පුස්තකාල සඳහා පොත් මිල දී ගැනීමට අවැසි වුවහොත් ඔවුන් විසින් කරනු ලබන්නේ, පොත් මිල දී ගැනීම සඳහා ලැබුණු මුළු මුදලේ වටිනාකමට නිකුත් කළ චෙක්පතක් විෂය භාර නිලධාරියකු හෝ නිලධාරීන් කිහිප දෙනකු සමග කොළඹ පිහිටි ප්‍රසිද්ධ පොත් ප්‍රකාශන ආයතනයක් වෙත යැවීම ය. මෙහි දී සිදුවන්නේ, ඔවුන් රැගෙන ආ චෙක්පත අදාළ ආයතනයේ ප්‍රධානියා වෙත භාරදුන් පසු, ඔහු චෙක්පත රැගෙන ආ පුද්ගලයාට හෝ කණ්ඩායමට ඒ මොහොතේ ම යම් මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කිරීම ය. ප්‍රකාශකයාට ලැබුණේ ලක්ෂයක චෙක්පතක් නම්, ඔහු ප්‍රදානය කරන මුදල අවම වශයෙන් දස දහසකි. අනතුරුව එම මුදල ලබා ගන්නා නිලධාරියා හෝ කණ්ඩායම තම තමන්ට අවැසි විවිධ බඩු භාණ්ඩ මිල දී ගැනීම සඳහා පොත් ප්‍රකාශන ආයතනයෙන් බැහැර යති.

ඉක්බිතිව එළැඹෙන්නේ ප්‍රකාශන හිමිකරුගේ භූමිකාව ය. පොත් මිල දී ගැනීමට පැමිණි නිලධාරියා හෝ කණ්ඩායම ආයතනය වෙත ලබා දුන් පොත් ලැයිස්තුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ප්‍රකාශන ආයතනයේ හිමිකරු අපූරු ක්‍රියාවක් සිදු කරයි. එනම්, අලෙවි කර ගැනීමට අපහසුව ඉතිරිව ඇති විවිධ පොත් වර්ගවලින් ඉතිරි මුදල පියවීම ය.

තමන් වෙත ලද සන්තෝෂම් මුදල ද රැගෙන සාප්පු සවාරි ගිය නිලධාරියා හෝ කණ්ඩායම නැවත ප්‍රකාශන ආයතනය වෙත පැමිණෙති. එවිට ඔවුන් රැගෙන ආ චෙක්පතේ වටිනාකමට සියයට විස්සක වට්ටමක් ද සහිතව පොත් මිටි කිහිපයක් බැඳ තබා ඇත. අදාළ නිලධාරියා හෝ කණ්ඩායම මෙම පොත් මිටි කිහිපය රැගෙන යන්නේ කිසිදු වගවිභාගයකින් තොරව ය.

මෙම ක්‍රමය හරහා ඉහළ අගයකින් හෙබි පොතපත රාජ්‍ය පුස්තකාලවලට ලැබේ යැයි කෙසේ නම් විශ්වාස කළ හැකිද?

එම ක්‍රමයෙන් බැහැරව වඩා ඵලදායි කෘති රාජ්‍ය ආයතන ව්‍යුහය තුළ තිබෙන පුස්තකාල වෙත නිකුත් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමයක් මෙම ලියුම්කරු යෝජනා කරයි.

පළමුවෙන් ම කළ යුත්තේ ප්‍රකාශන ආයතනවලින් පොත් මිල දී ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් යෙදීම ය. මෙහි දී, මුද්‍රණය කළ ඕනෑ ම කෘතියක් මිල දී ගැනීම නුසුදුසු හෙයින් විවිධ විෂයයන් සඳහා ලියැවෙන කෘතීන් කියවා ඒවායේ සුදුසු නුසුදුසු බව තහවුරු කිරීම සඳහා මණ්ඩලයක් පත්කළ යුතු ය. එමෙන් ම ඔවුන් මේ සඳහා විශේෂ කැපවීමක් කළ යුතු ය. මෙම පිරිස සාම්ප්‍රදායික රාමුවේ සිර වූ පුද්ගලයින් මෙන් ම නව අත්හදා බැලීම් සහ නව හැදෑරීම් සහිත පිරිසකගෙන් සමන්විත විය යුතු ය. එමෙන් ම ඔවුන් හුදු පෞද්ගලික මතවාදයන් පදනම් කොටගෙන කෘති පරීක්ෂා නොකළ යුතු ය. මේ සඳහා තෝරා ගන්නා පිරිස වැටුපට සරිලන ප්‍රමාණයට පමණක් සේවය නොකරන පිරිසක් විය යුතුය. ඔවුන් ගේ සේවය මත රටේ අනාගත පරපුරේ දැනුම සංවර්ධනය විය යුතු අතර, ඒ සඳහා නූතන දැනුම සොයා ගොස් එම දැනුම තුළින් තමන් වෙත ලැබෙන කෘති ඇගයීමට ලක් කළ යුතු ය.

## ප්‍රකාශන ආයතන සහය

මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රකාශන ආයතන ද සහය දැක්විය යුතු ය. විශේෂයෙන් ම ඔවුන් තම ආයතන විසින් ප්‍රකාශයට පත්කරනු ලබන කෘතියේ එක් පිටපතක් හෝ දෙකක් සෑම මසක ම පස්වන හෝ දහවන දින අතර අදාළ ආයතනය වෙත ලැබීමට සැලැස්විය යුතු ය. අදාළ ආයතනය විසින් මසක් ඇතුළත එම කෘතිය පරීක්ෂා කොට එය මිල දී ගන්නවා ද, නැද්ද යන්න පිළිබඳව ප්‍රකාශන ආයතනයට දැන්විය යුතු ය. ඉක්බිතිව මිල දී නොගන්නා කෘතියේ පිටපත අදාළ ප්‍රකාශන ආයතනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. පොත් මිල දී ගන්නා රාජ්‍ය ආයතනය නිරතුරුව ම මෙම සම්බන්ධතාව පවත්වාගෙන යායතු අතර, එය දෙපාර්ශ්වයේ ම යහපතට හේතු වනු ඇත.

මෙම පොත් මිල දී ගන්නා ආයතනය රාජ්‍ය ආයතනයක් බැවින්, රාජ්‍ය ආයතනය වෙත ලබාගන්නා සියලු කෘතීන් මෙම ආයතන හරහා මිල දී ගත යුතු බව අදාළ ආයතන වෙත දැන්විය යුතු ය. එමෙන් ම රාජ්‍ය ආයතන වෙත පොත් මිල දී ගැනීම සඳහා වසර ආරම්භයේ දී ලැබෙන ප්‍රතිපාදන එකවර වියදම් නොකොට මාස්පතා පොත් මිල දී ගැනීම සඳහා මෙම මුදල් වෙන් කොට තැබිය යුතු බව එම ආයතන වෙත අවධාරණය කළ යුතු ය.

මෙලෙස මාස්පතා ප්‍රකාශන ආයතනවලින් මිල දී ගන්නා කෘතීන් සියයට හතළිහක වට්ටමක් මත මිල දී ගත යුතු අතර, අදාළ ආයතන වෙත එම පොත් අලෙවි කිරීමේ දී ඔවුනට සියයට විස්සක වට්ටමක් ලබා දිය යුතු ය. එවිට පොත් මිල දී ගන්නා ආයතනයේ පැවැත්ම සඳහා ඉතිරි සියයට විස්ස යෙදවිය හැකි ය. මෙහි දී පොත් ලෙස සැලකිය හැකි පොත් පමණක් රාජ්‍ය ආයතන තුළ පවතින පුස්තකාල වෙත ලැබීම ස්වයංක්‍රීයව සිදුවන බව ස්ථිර ය. අවර ගණයේ පොත් අලෙවි කර, ගැනීම අදාළ ප්‍රකාශකයින්ගේ වගකීමක් වන අතර, එවැනි පොත් රාජ්‍ය ව්‍යුහය තුළ පවතින පුස්තකාල වෙත ලැබීම ද මින් වැළකෙනු ඇත. වර්තමානයේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පත්කළ ද, එම පොත් අලෙවි කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් සකසා නොමැත. එබැවින් ඔවුන්ට ද මෙම වැඩපිළිවෙළ උපකාරී වනු ඇත.

## අලෙවි කළ යුත්තේ කාටද?

මෙම වැඩ පිළිවෙළ ඉදිරිපත් කිරීමේ දී පොත් මිල දී ගැනීම සහ අලෙවි කිරීම පිළිබඳ කෙතරම් අදහස් දැක්වුව ද අලෙවි කරන්නේ කාටද යන්න මෙතෙක් අනාවරණය නොවී ය. දැන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරමු.

මෙරට විදග්ධ පාඨක පිරිසක් බිහිකිරීමේ මූලික වගකීම පැවරී තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ය. ඒ මන්ද යත්, කියැවීම හුරු කළ යුත්තේ පාසල තුළින් බැවිනි. 2011 වර්ෂයේ දත්තවලට අනුව මෙරට පිහිටි පාසල් පුස්තකාල ප්‍රමාණය 5448 කි. එක් පොතකින් පිටපත් 1000ක් අලෙවි කර ගැනීමට නොහැකි යැයි නගන අඳෝනාවලට නිසි පිළිතුරක් මෙහි අඩංගුව නොමැති ද?

**'පොත් මිල දී ගන්නේ කවුද?'** යන පැනයට පිළිතුරු මතු දැක්වෙන තොරතුරුවලින් ද සනාථ වනු ඇත.

2011 වසර අවසානයේ දී කළ ගණන් ගැනීමට අනුව රාජ්‍ය ව්‍යුහය විසින් පාලනය වන, රට තුළ පිහිටා ඇති ස්ථිර පුස්තකාල ප්‍රමාණය මෙසේ ය.

| | | |
|---|---|---|
| රාජ්‍ය දෙපාර්තමේන්තු | - | 34 |
| විශ්වවිද්‍යාල ආයතන | - | 13 |
| විශ්වවිද්‍යාල | - | 59 |
| පාසල් | - | 5,448 |
| මහජන පුස්තකාල | - | 1,133 |
| පිරිවෙන් පුස්තකාල | - | 712 |
| ගුරු විද්‍යාල සහ විද්‍යා පීඨ | - | 29 |
| කාර්මික විද්‍යාල | - | 34 |
| විශේෂ පුස්තකාල | - | 65 |
| පර්යේෂණ පුස්තකාල | - | 21 |
| වෙනත් | - | 10 |
| **එකතුව** | - | 7,558 |

(තොරතුරු සපයා ගැනීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය. එහි ගරු අධ්‍යක්ෂ ජී.ඩී. අමරසිරි මහතාට විශේෂ ස්තුතිය පුද කරමි.)

රාජ්‍ය ආයතන ව්‍යුහය නිසි කළමනාකරණයකින් යුතුව පොත් මිල දී ගන්නේ නම්, අවම වශයෙන් එක පොතකින් පිටපත් 7,000 ක් අලෙවි කරගැනීම ඉතාමත් පහසු කාර්යයක් බව මින් පැහැදිලි නොවන්නේ ද? මෙම වැඩපිළිවෙළ සාර්ථක වන්නේ නම් ලේඛක ලේඛිකාවන්ට කෙතරම් යහපතක් සිදුවන්නේ ද? ප්‍රකාශන ආයතන, යෝජිත මිල දී ගැනීමේ ආයතනය සහ ඉහත සඳහන් ආයතන අට අත්වැල් බැඳ ගන්නේ නම් පොත් අලෙවි කිරීම, පොත් මිල දී ගැනීම සහ පාඨකයින් වෙත උසස් ප්‍රමිතියෙන් යුත් පොත් ලැබීම ස්වයංක්‍රීයව සිදුවන බව මින් පැහැදිලි වන්නේ ය.

2013 වසර එළඹ ඇත. මෙම යෝජනාව පිළිබඳ අවධානය යොමුකොට එළඹෙන වසර සඳහා පොත් මිල දී ගැනීමේ දී මෙකී පිළිවෙත වෙත පිවිසීමට රාජ්‍ය ව්‍යුහය සූදානම් කළ හැකි නම් පොත් ප්‍රකාශයින්ට සහ පාඨකයින්ට වාසනාවන්ත කාලයක් උදාවනු ඇතැයි විශ්වාස කළ හැකි ය.



**ජයසිරි අලවත්ත**

*නිදහස් මාධ්‍යවේදියෙකි*

කෙටිකතාව

# ගේට්ටුවේ අමුත්තෝ

නගරයේ දකුණු දිසා අන්තයෙහි පිහිටි මළවුන් නිදන උස්බිම දෙසින් හමා ආ උදෑසන සිහිල් සුළඟ මුනුමුනු ගාමින් විසිර යයි. වැසි සමය උදාවී තිබූ හෙයින් පරිසරය අළු පැහැයක් ගත්තේය. දේවස්ථාන භූමියෙහි වූ පැරැණි මාර ගසෙන් අහසට නැඟුණු කවුඩන් දෙදෙනෙක් එකිනෙකා පරයන්නට මෙන් පියාසලන්නට ගත්හ.

වීදියෙහි ඇති පැරැණි නිවසක වෙසෙන විශ්‍රාමලත් විදුහල්පතිවරයෙකු වන හේරත් මහතා තම කන්තෝරු කාමරය තුළ බුත්සරණ කියවමින් සිටියේය. සැම උදෑසනකම කිරි කෝපි කෝප්පයක් පානය කිරීමෙන් පසු සිංහල සම්භාව්‍ය සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක පිටු කීපයක් කියැවීම ඔහුගේ සිරිතකි. මේ උදෑසන අතපොවන දුරක වූයේ 'බුත්සරණ'ය.

"...දර ගෙනෙනුවෝ, තණ ගෙනෙනුවෝ ඔවුන් දැක වහන්ස, ඒ මඟ නොවැඩියැ මැනැව. ඒ නුඹ ඉදිරියේ මල් කඩැ මවුන් නොහඳුනන, පියන් නොහඳුනන, ශ්‍රමණ - බ්‍රහ්මණයන් නොහඳුනන, මෙලෝ පරලෝ නොදන්නා, දුටු දුටුවන් මරා ඇඟිලි කපා එයින් මාල ගොතා කරැලන, කප් ගින්නක් සේ රළු වූ අංගුලිමාල නම් සොරෙක් ඇත. ඒ වාත වේගයෙන් දිවන අසුහුද ලුහුබඳවා ගත්තේය. මෙසේ සන්හිඳි වඩිනා නුඹ අයත්නයෙන් අවුත් මරා ඇඟිලි කපාගත නපුර. නැවැත්තැ මැනැවැ'යි කියත්ලු..."

සෙරෙප්පු හඬක් නැඟුණි.

කන්තෝරු කාමරයේ දොරෙන් එබී බැලූ හේරත් මහත්මියගේ මුහුණට මොකක්දෝ වී තිබුණි. පොත පහත් කළ හේරත් මහතා කුහුල් බැල්මක් හෙළීය.

"ඒයි! අපේ ගේට්ටු කණු දෙක උඩ ඔළු දෙකක්." ඇගේ හඬ වෙවුලුවේය. තොලකට සැලුණේය.

"මොකක්?"

හේරත් උපැස් යුවළට උඩින් බැලුවේය.

"ඔය ඇහෙන්නේ බල්ලෝ බුරනවා."

බුත්සරණ වසා මේසය මත තැබූ හේරත් කැළඹීම නොපෙන්වා නැගිටින්නට තැත් කළ නමුදු, ඔහුගේ සරම් ගැටය ලිහිල්ව තිබූ බැවින් එය දණහිස ළඟටම රූරා වැටුණේය.

බිරිඳ ඉස්සරම සිටියාය. හේරත් ඈ පසුපසින් ගොස් ඉස්සරහ දොර අසලදී ඉස්සර වූයේය.

ඍජුකෝණාශ්‍රාකාර කුඩා ගෙළයන ඉදිරිපස පෙනෙන සුදු පිරියම් කළ ගේට්ටු කුලුනු දෙක මත කළු පැහැති ගෝලාකාර වස්තූන් දෙකක් දිස්වෙයි. ගෙදර බල්ලා වන සිම්බා ගේට්ටුව දෙපසට දුව පනිමින් බුරයි. පාරේ සිටින හොරිකඩයෙක් උඩු බුරලයි.

"ඒ... ඒ... ඔළුද?"

හේරත්, ගේට්ටුව වෙත දිවෙන වැලි තීරුව මැද නැවතී ඇසුවේය.

"මිනී ඔළු. මම දන්නෙ නැතුව ළඟටම ගියා. බල්ලො බුරන්නෙ මොකද බලන්ඩ. සමහරදාට උන් කුණු මල්ල ඇදල දානවනේ."

හේරත් තවත් පියවර කීපයක් ඉදිරියට ගියේය. ගෙළ ළඟින් වෙන් කළ තරුණ හිස් ගෙඩි දෙකක් ගේට්ටු කණු මත තබා ඇති බව සැකහැර දැන ගත්තේය. දෙහිසම තරමක් කළු පැහැගැන්වී ඇත. එක් හිසක්, පසෙකට ඇලවී ඇත. ගල් කැටයක් ඇහිඳ පාරේ රොක්වන බල්ලන්ට දමා ගැසූ හේරත්, ගෙදර බල්ලා ඇතුළට කැඳවීය. පාර තවමත් පාළුය. වාහනයක් යන හඬක් හෝ නොඇසෙයි. ඇඳිරි නීති කාල සීමාව පැන ඇතත් තවමත් කිසිවකු පාරට බැස නැති සේය.

ආපසු හැරී බැලූ හේරත් බිරියගේ බියපත් මුහුණ දැක, වහා ඇය වෙත ගියේය.

"අපි දැන් මොකද කරන්නෙ?" ඇය ඇසුවාය. හේරත් මොහොතක් කල්පනා කළේය.

"පොලිසියට කියමුද?"

"ඊට පස්සෙ අපිට කරදර වෙයිද? කට උත්තර දෙන්ඩ යන්ඩ වෙයිද?"

"හ්ම්...! එහෙම දේකුත් තියෙනවා තමයි."

"ඔයා ඒ මූණු අඳුරුවද? මේ පැත්තේ දෙන්නෙක්ද?"

"අඳුර ගන්ඩ බෑ. කළු ගැහිලා."

"අයිතිකාරයො දන්නවනං අරං යයි නේද?"

"විකාරද? පහුගිය දවස්වල හන්දි ගානෙ තිබුණු මළ කඳන් කවුරුවත් භාර ගත්තයැ."

"ඇයි මේවා අපේ ගේට්ටු කණු උඩම තිබ්බේ?"

"නිකං වෙන්ඩැති. පාරෙ යන එන අයට පේන්ඩ."

"අපිට තර්ජනයක්වත්ද?" හේරත් බිරිඳ දෙස නුරුස්නා බැල්මක් හෙළීය.

"මොනවටද? අපි මොනව කළාටද?"

"වැරදීමක්වත්ද? මෙහෙ කියලා හිතාගෙන..."

"ඕන නැති කතා නැතුව ඉන්ඩ. අපිට දරුවොවත් ඉන්න එකක්යැ. මේ වෙලාවට අපි මෙතන ඉන්න එකත් වැරදියි. යමු ගෙට. දොර වහගමු. මේ මොකුත් දන්නෙ නෑ වගේ ඉමු. බලමුකො නවය දහය වෙනකොට මොකද වෙන්නෙ කියලා..."

"ඔව්! සමහර විට ආපහු අරගෙන යයි නේද?" හේරත් යුවළ ඉක්මනින් ගෙට වැදී දොර වසා ගත්හ. ඉන් පසු නාන කාමරයට ගිය හේරත්, විෂබීජ නාශක සබන් ගා, දෑත හා මුහුණ ද සෝදා ගත්තේ මිනී ඔළු දෙක අතින් ඇල්ලූ කලෙක මෙනි. එහෙත්, දුරින් සිට හෝ ඒවා දැකීමෙන් ඇති වූ අපුල සිතෙහි නළියයි.

යළිත් කන්තෝරු කාමරය වෙත පැමිණි හේරත් එහි ජනෙල් පියනක් බාගෙට ඇර ඉන් පිටත බැලුවේය.

බඩ් අඹ ගසේ අතු අතරින් ගේට්ටුවේ කොටසක් පෙනෙයි. කපුටෝ කීප දෙනෙක් කෑ ගසමින් ගේට්ටුව අසල ඒ මේ අත සරති. බිරියද ජනේලය අසලට අවුත්, එබී බලයි.

"කපුටෝ පිරිල නේද? උන් ඒව බිමට ඇදල දායි."

"එහෙම වුණොත් හොඳයි. එතකොට බල්ලො ඇදන් යයි වෙන කොහෙට හරි."

"ඒක හොඳයි. එතකොට අපේ සම්බන්ධයක් නෑනෙ" යුවළ එකිනෙකා දෙස බලමින් හිස් සැලූහ.

මොහොතකට පසු පාතරාසය ගැනීම සඳහා කෑම මේසය වෙත ගියද හේරත් යුවළ තුළ පිරියක් නොවීය. කළු පැහැයට හුරු මාළු දීසිය දෙස බලා සිටි හේරත් පාන් පෙත්තකින් බාගයක් බටර් සමඟ කා ඉක්මනින් නැගිට්ටේය. බිරිඳ කෑවේ කෙසෙල් ගෙඩියක් පමණි.

ඉස්තෝප්පුවේ පුටු දෙකක හිඳගත් ඔවුහු මඳක් ඉදිරියට නැඹුරුව කල්පනාකාරීව සිටියේ කොයි මොහොතක හෝ සිදුවිය හැකි කුමක් හෝ දෙයකට මුහුණපෑමට සූදානමින් මෙනි.

නිශ්ශබ්දතාව බිඳිමින් හේරත් බිරිය කතා කළාය.

"තව ටිකකින් පියුන් එනවනෙ. මිනිහ මේක දැකලා ගෙයක් ගෙයක් ගානෙ කියයි" හේරත් හිස කැසුවේය. දෙතොල් ඇද කළේය.

"තවත් ගෙවල්වල ගේට්ටු කණු උඩ ඔළු තියලනං ප්‍රශ්නයක් නෑ. එතකොට පියුන්ට අපේ ගේට්ටුව ගාණක් නැතුව යනවා."

"නෑ...! එහෙනං මීට වැඩිය බල්ලො, කපුටෝ කෑ ගහනව ඇහෙනවා. උන් අපේ ගේට්ටුව ළඟ විතරයි කැරකෙන්නෙ."

හේරත්ට හිත හදා ගැනීමට බිරියගෙන් ඉඩක් නොලැබෙයි. ඔහු ඇය දෙස බැලුවේ කෝපයෙනි. එහෙත්, ඇයගේ බියපත් අහිංසක මුහුණ දුටු ඔහු තුළ ශෝකයක් ඇති විය.

"අපිට බයවෙන්ඩ දෙයක් නෑ. මොකද මේක අපි කරපු දෙයක් යැ" හේරත් සෙමින් කීවේ බිරිය අස්වසාලනු පිණිසය.

"ග්‍රාම සේවකට කියල තිබ්බොත් නරකද?" ඇය අසයි.

"මිනිහ මේ දවස්වල කන්තෝරුවට එනවද?"

"දවල් වෙලා ගිහින් බලන්ඩ."

"එතකොට මිනිස්සු වෙන දෙයක් හිතයි. අපි ඔත්තු කියනව කියලා."

"කී අතකින් බේරෙන්ඩද?"

"අද දවසට ඉවසල ඉමු. මේක කරපු ඇයොම ඉතුරු හරියක් බලාගන් නැතෑ. ඒ නැතත් හැමදාම ඒ ඔළු දෙක එතන තියෙයියැ."

මධ්‍යාහ්නය වන තුරු කිසිවක් සිදු වූයේ නැත. ලියුම් නැති නිසාදෝ පියුන් ආවේද නැත.

හේරත් සාලයෙන් ඉස්තෝප්පුවේත් ඒ මේ අත සක්මන් කළේය. අතරින් පතර ජනේලය වෙත ගොස්, එය යාන්තමට ඇර බලයි. හිස් ගෙඩි දෙක නිරුපද්‍රිතය.

බිරිය හිසරදයක් ගැන කියමින් බෙහෙත් පෙති දෙකක් බී නිදන කාමරයට ගිය නමුදු, වරින්වර නැගිට ආවේ අලුත්ම තත්ත්වය ගැන දැනගනු පිණිසය. කිසිදු විශේෂයක් නැති හෙයින් ඇය ආපසු ඇඳේ වැටෙන්නේ කනස්සලු සිතිනි.

සවස දෙකට පමණ අසල්වැසි වඩුගේ දුරකථනයෙන් කතා කළේය.

"මිස්ට හේරත්...! ගේට්ටු කණු දෙක උඩ ඔළු දෙකක් තියෙනවා නේද?"

"ඔව්... ඔව්... අපිත් දැක්කා."

"ඒවා නරක් වෙන්ඩ කලින් මොනව හරි කරන්ඩ වෙයි නේද? නැත්තං අපිටත් ගෙවල්වල ඉන්ඩ බැරි වෙයි."

"අපිත් මේ බලන් ඉන්නෙ ඒක තමයි මිස්ටර් වඩුගේ. ඒත් ඉතින් අපි කියලා... අනික අපිට අදාළත් නැහැනෙ... ඒ වගේම මේ දවස්වල..."

හේරත්ගේ අසම්පූර්ණ කෙටි වැකි සහිත පිළිතුරත් සමඟම ඇමතුම ද නිමාවිය.

"වඩුගේ විතරයි නිකමටවත් හොයලා බැලුවෙ. එයා හොඳ අසල්වැසියෙක්" හේරත් බිරිය කීවාය.

"මිනිහා කොහොමටත් පරිසරවේදියනෙ" හේරත් එසේ කියමින් හිස වැනුවේය.

"වඩුගේගේ දුව ඉලන්දාරියෙක් එක්ක පැනල ගිය වෙලාවේ එයා පොලිසි ගියේ ඔයත් එක්ක." හේරත් බිරිය තවත් දෙයක් මතක් කළාය.

දිවා ආහාරයේදී ද උඩින් පල්ලෙන් පිඟාන අත ගා කටක් දෙකටක් කෑ හේරත් පැරැණි දිනපොත් ඇද තමන් දන්නා කියන පොලිස් හා හමුදා නිලධාරීන්ගේ නම්ගම්, දුරකථන අංක සෙවීමට ගත්තේය. ඔහුගේ ගෝලබාලයින් බොහෝ දෙනෙක් ආරක්ෂක අංශවල නිලතල දරති.

උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් බැඳුණු නුගපිටිය දැන් පොලිස් සුපිරින්ටන්ඩන්වරයෙකි. පාසලේ උත්සවයකට පැමිණි අවස්ථාවේ නිල ඇඳුම පිටින්ම දෙකට නැවී හේරත්ට වැඳ ආචාර කළ ඔහු තම විසිටින් කාඩ්පතක් ද දුන්නේ "ඕනෑම දෙයකට කතා කරන්නැ"යි කියමිනි.

දිනපොතක් ~~තුළ~~ තිබූ එම කාඩ්පත සොයාගත් හේරත් එහි ඇති අංකයට ඇමතුමක් දුන්නේය. අංකය නිවැරැදිය. ඒ රත්නපුර පොලිස් අධිකාරී කාර්යාලයයි. එහෙත්, නුගපිටිය මහතා දැන් පොලිස් සේවයෙන් විශ්‍රාම ගෙන ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගොස් සිටී.

පළමු උත්සාහය අසාර්ථක වූ නමුදු, හේරත් තවත් දිනපොත් පෙරළන්නට වූයේය. ආරක්ෂක අංශවල සිටින මිතුරන් හා ගෝලයින් ගණන ඔහු සිත තුළ ආරක්ෂාකාරී හැඟීමක් ඇති කරවයි. එහෙත්, දැන්ම මේ සිද්ධිය ඔවුන්ට දන්වා තිබීම හොඳ නැති බවක් ඔහුට හැඟෙයි. කරදරයක් සිදුවුවහොත් පමණක් කතා කළ හැකි අංක හා නම් කීපයක් ඔහු කඩදාසි තීරුවක සටහන් කර ගත්තේය. බිරිඳටද පෙන්නුවේය.

"ඇයි අපේ සෑම් මාමගෙ පොඩි පුතා ඉන්නෙත් නේවි එකේනෙ. එයා කමාන්ඩර් කෙනෙක්" හේරත් බිරිඳ කීවාය.

"එයා ඉන්නෙ නැවකනෙ. අපේ ගේට්ටු කණු දෙක උඩ මිනී ඔළු දෙකක් තියෙනව කිව්වම මිනිහ නැව හරවාගෙන එන්ඩයැ."

බිරිඳගේ නෑසියන්ගෙන් උදව් ලැබීමට හේරත් කොහෙත්ම කැමති නැත.

වැහි අඳුර නිසාදෝ සවස් කාලය ඉක්මනින් ගෙවී ගියාක් මෙන් දැනුණි. ඕනෑම නුහුරු තැනක් හෝ දෙයක් කාලයත් සමඟ හුරු වන්නා සේ, මිනිස් හිස් පිළිබඳව උදැසන තිබූ ආතතිය සවස් වන විට තරමක් අඩු වී ඇති බවක් හේරත්ට හැඟුණි. බිරිඳ රූපවාහිනියෙන් ටෙලිනාට්‍යයක්ද නැරඹුවාය.

රාත්‍රියේ මහ හඬින් වසින්නට විය. එක පිට එක විදුලි කෙටුවේය. අකුණු ගැසුවේය. හේරත් යුවළ උඩුබැලි අතට ඇඳේ වැතිර කල්පනා කරමින් සිටියහ.

වැස්සත්, සුළඟත් විසින් බිම හෙළනු ලබන හිස්ගෙඩි දෙක කාණුවට වැටී ගසාගෙන

ගොස් ගංදියෙහි ඈතට පාව යනු ඇත. මාළුන්ගේ කෙටීමට ලක්ව විකෘති වන හිස් ගෙඩි කිසිවෙකුටත් හඳුනාගත නොහැකි වනු ඇත. අවසානයේ හිස්කබල් දෙක ගං පතුලෙහි රැඳී, කාලයාගේ ඇවෑමෙන් විනාශයට පත්වනු ඇත. හේරත් සිතුවේ එසේය.

එහෙත්, සිදුවූයේ වැහි සුළඟින් බිම පතිත වූ හිස් ගෙඩි දෙක මිදුලේ පිැරුණු වතුරේ පාවී ආවුත් ගේ ඉදිරිපස පඩිය අසල රැඳීමය. කොළ රොඩු අතරේ සිරවී, කානු ගැට්ටේද වදිමින් තිබූ දෙහිස, වතුර බැස යද්දී එකිනෙකා දෙස බලා සිටින අයුරින් නිසල වුණි.

නිදියහනේ වැතිර සිටිය ද හේරත්ට නින්දක් නොවීය. පළිඟු බෝල දෙකක් හිස තුළ ඒ මේ අත යන්නාක් මෙන් වේදනාවක් දැනුණි.

රාත්‍රී බෙහෙත් පෙති ටික ගැනීමෙන් පසු හේරත් මහත්මියට නම් නින්ද ගියේය. ඇය අවදි වෙතැයි බියෙන්, හේරත් ඒ මේ අත නොහැරී උඩුබැලි අතටම සිටියේය.

වැස්ස තරමක් තුරල් කළේය. මධ්‍යම රාත්‍රිය ඉතා නිශ්ශබ්දව ගෙවී යමින් තිබුණි. එක්වරම පිටතින් කිසිවෙකු කතාකරන හඬක් නැගුණි.

"හේරත් සර්... හේරත් සර්..."

විදුලි පන්දමද අතින් ගත් හේරත් නැගී සිටියේය. මේ මහ රෑ පැමිණ සිටින්නේ කවුරුන්ද? ඉස්තෝප්පුව වෙත ගිය ඔහු විදුලි පහන් නොදල්වාම ජනෙල් පියනෙන් එබී බැල්වේය.

"කවුද?"

"සර්! මේ අපි."

"අපි කිව්වේ?"

පිටත කිසිවෙකු පෙනෙන්නට නැත. හේරත් විදුලි පන්දම දල්වා හොඳින් වටපිට බැලුවේය. දොර පඩිය මත තිබෙන හිස් ගෙඩි දෙක දුටුවේ එවිටය.

"සර්ට මේ විදිහට අපිව අඳුර ගන්ඩ අමාරු ඇති. අපි සෙන්ට්‍රල් එකේ ඉගෙන ගත්ත, සර්ගෙ ගෝලයෝ දෙන්නෙක්."

"මොනවා...?"

"ඔව් සර්. මම ජයසේකර... මෙයා අමරනාත්."

කවන්ධය අහිමි හිස් ගෙඩි දෙකක් වුණත්, ඔවුන් තම ගෝලයන් වීම ගැන හේරත් තුළ සියුම් ශෝකයක් මෙන්ම සතුටක්ද ඇති විය.

"එතකොට තමුසෙලා තවම මැරිලා නෑ...?"

"නෑ සර්...!"

"ඒක හරි පුදුම වැඩක්නෙ. ශරීරය නැතුව ඔළුවට විතරක් පුළුවන්ද ජීවත් වෙන්ඩ?"

"පුළුවන් සර්. අපිත් දැන් තමයි ඒක තේරුම් ගත්තේ."

ජයසේකරගේ හිස කීවේය. අමරනාත්ද කතා කරන්නට විය.

"ඇත්තටම සර් මේක අපිට හොඳ අත්දැකීමක්."

"ඉතින් තමුසෙලාට මොකද මේ විපත්තිය වුණේ? මට මතකයි තමුසෙලා හොඳට ඉගෙන ගත්තනෙ. මොන එහෙකටද ඔය දේශපාලනේ කරන්න ගියේ?" හේරත් දොරගුළු හරිමින් කීවේය.

"අපි කරපු දේශපාලනයක් නෑ සර්. මේක පළිගැනීමක්." ජයසේකර පිළිතුරු දුන්නේය.

"අපිව ඇතුළට අරන් ඔය ටීපෝ දෙකක් උඩ තියන්ඩ සර්. අද පුදුම හීතලක්

තියෙන්නෙ. ඊළඟ වැස්සට අහුවුණොත් අපිට නිව්මෝනියාව හැදිලා මැරෙනවා."

වැස්සට තෙමී, ඇලී තිබූ හිසකෙසින් අල්ලා හිස් ගෙඩි දෙක ඈතට ගත් හේරත්, ඉස්තෝප්පුවේ වූ ටීපෝ දෙකක් මත පරිස්සමින් තැන්පත් කළේය. ඉන් පසු හේරත්ද හිඳගත්තේය.

"තමුසෙලා මොනව හරි බොනවද?"

"කරදර වෙන්ඩ එපා සර්. කඳ නැතිව කනබොන එකේ තේරුමක් නෑ. නිකං අපතේ යනව විතරයි." අමරනාත් කීවේය.

"කඳ නැති හින්දා බඩගිනි වෙන්නෙත් නෑ" ජයසේකර සෙමින් කීවේය.

බිරිඳ නැඟිටියහොත් මේ දර්ශනයෙන් බියපත් වන්නට පිළිවන. ඊට පෙර කළ යුත්තක් කළ යුතුය. අමුත්තන් දෙදෙනකු මෙන් ඉස්තෝප්පුවේ සිටින මේ හිස් ගෙඩි දෙකෙන් ගැලවෙන්නේ කෙසේද?" හේරත් සර්ගේ සිතිවිලි වැටහුණාක් මෙන් අමරනාත් කතා කළේය.

"සර්... අපි කැමති නෑ අපි නිසා සර් අමාරුවේ වැටෙනවට. පුළුවන් ඉක්මනට අපි මෙතනින් යන්න ඕනෙ. සර්ට අපිට කරන්න පුළුවන් උපකාරය තමයි අපේ කඳන් දෙක හොයලා දෙන එක."

"අනේ ඔව් සර්. හිසට පණ තිබුණට කඳ නැතුව වැඩක් නෑ සර්."

ජයසේකර ද බැගෑපත් වූයේය. ඔහු පාසලේ සිටියදී වොලිබෝල් කණ්ඩායමේ නායකයාව සිටි බවද හේරත්ට සිහියට නැඟුණි. අමරනාත්, සමස්ත ලංකා තරගවලටද සහභාගි වූ රිටි පනින්නෙකි.

"හොඳයි... මං උත්සාහ කරලා බලන්නං..." හේරත් තම ගෝලයින් දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බලමින් කීවේය. ඔහු නින්දට ගියේ අලුයමෙහිය. අර්ථවත් සංවාදයක යෙදීම සඳහා ශරීරය නැති, හිස් පමණක් ඇති මිනිසුන් දෙතුන් දෙනෙකු වුව ප්‍රමාණවත් බව ඔහු එදින අවබෝධ කරගෙන තිබුණි.

හේරත් අවදි වූයේ උදෑසන හතට පමණ ආ දුරකථන ඇමතුමකිනි.

"මම වඩුගේ කතා කරන්නෙ. අර ඔළු දෙකට මොකද කරගත්තෙ?"

"ඒවා කවුරුහරි අරගෙන ගිහිල්ලා."

"මිස්ට හේරත්! අද පාන්දර අපේ ගේට්ටු කණු දෙක ළඟ හිස නැති මළකඳන් දෙකක් තියලා ගිහිල්ලනෙ."

"හත් දෙයියනේ... මොන වගේ අයද...? තරුණයොද?"

"මොකක්ද මිස්ටර් ඇහුවේ?"

"නෑ... නෑ... මං මේ හිතුවෙ හිස් දෙකක් වගේයැ කඳන් දෙකත් ගේ ඉස්සරහ තියෙන එක. හරියට තෙපොංගලවලට කෙහෙල් ගස් හිටෙව්ව වගේ..."

"අද අපේ වයිෆ් වැඩට ගියෙත් පිටිපස්සේ දොරෙන්. මේකට අපි මොනවද කරන්න ඕනෙ මිස්ටර් හේරත්? මට පොඩි උපදෙසක් දෙන්ඩකො."

"අපි නං කෙරුවෙ නිශ්ශබ්දව බලන් හිටපු එක. ඒත් ඔතන කඳන් දෙකක්නෙ. නරක් වුණොත් පළාතේ ඉන්න බැරිවෙයි."

"ඒක තමයි මිස්ට හේරත්. මගේ වීස් එකත් වැඩි වෙන්ඩ පුළුවන්. අපි පොලිසියට කියමුද? මිස්ට හේරත් අඳුනන අය ඉන්නවනෙ පොලිසියෙ."

"එපා! දැන්ම එපා. මං පොඩි වැඩ පිළිවෙළක් කල්පනා කරලා කියන්නං. එතකල් කලබල නොවී ඉන්ඩ."

පොටක් පැදීගෙන එන බව හේරත්ට හැඟුණි. ඔහු ආපසු ඉස්තෝප්පුවට එන විට ජයසේකර හා අමරනාත්ද දුරකථන සංවාදයට ඇහුම්කන් දී සිටි බවක් පෙනෙන්නට තිබුණි. ලේ සිඳී ගිලී තිබූ ඔවුනගේ ඇස් තුළ කිසියම් උද්‍යෝගයක ලකුණක්, දීප්තියක කණිකාවක් දිලිහුණි.

ගෝලයින්ගෙන්, ඔවුන්ගේ කවන්ධ පිළිබඳ අවශ්‍ය විස්තර අසාගත් හේරත්, ඉක්මනින් සැරසුණේ වඩුගේ නිවසට යාමටය. එහි ඇති සිරුරු තම ගෝලයින්ගේ දැයි සැකහැර දැනගත යුතුය.

මේ වන විට හේරත් මහත්මියද තම සැමියාගේ ගෝලයින් හඳුනාගෙන සිටි බැවින්, දඹදිව ගොස් එන විට ගෙන ආ ලොකු අවානකින් ඔවුන්ගේ හිස් මත වසන නිලමැස්සන් එළවමින් ප්‍රිය සල්ලාපයෙහි යෙදී සිටියාය. ඇත්තෙන්ම, මේ හිස් ගෙඩි දෙක නිසා හේරත් නිවසෙහි තිබූ ඒකාකාරී ජීවන රටාව බිඳීගොස්, කිසියම් ප්‍රබෝධයක්, ජීවයක් ඉපැදී තිබුණි.

හේරත්, ගෝලයින් දෙදෙනාගේ කතාව වඩුගේට කීවේ කවන්ධයන් දෙක ඔවුන්ගේ බව හඳුනා ගැනීමෙන් පසුවය. ඒ අසා සිටි වඩුගේ මුහුණෙහි සිනහවක් පිරී, මස් පිඬු පිම්බුණි. ඔහු හේරත් දෙස තියුණු බැල්මක් හෙළීය.

"මිස්ට හේරත්...! ඔය ගෝලයො දෙන්නම හොඳ බිස්නස්කාරයො කිව්ව නේද?"

"ඔව්! එක්කෙනෙක්ට හෝටල් දෙකක් තියෙනව හික්කඩුවෙ. අනිත් එක්කෙනා කරන්නෙ ජෙම් බිස්නස්. තරහකාරයොනෙ ඔය වැඩේ කරලා තියෙන්නෙ, දේශපාලනේට මුවාවෙලා."

වඩුගේ පුටුවේ ඉදිරියට ඇදී, හඬ බාලකොට කතා කරන්නට විය.

"මිස්ට හේරත්! මේක අපිට ලැබුණු හොඳ චාන්ස් එකක්. හිසයි, කඳයි එක් කරන්න අපි හොඳ ගාණක් ඉල්ලමු."

"ෂි... ෂි... ෂි...! ඒ මොන කැත වැඩක්ද?" හේරත් ලේන්සුවෙන් නළල පිසදා ගත්තේය.

"මොකක්ද කැත වැඩේ. මිස්ට හේරත් මේකට ගැවෙන්ඩ එපා. මං දෙන්නං ඩීල් එක. ඔළු දෙකේ ගාණ ඔයාගෙ එකවුන්ට් එකට දාන්නං. ඒක ගුරු පඬුරු කියල හිතා ගන්ඩකො."

"අනේ මන්දා"

"අපි ඒ මිනිස්සුන්ට කරන්නෙ ලොකු උදව්වක් මිස්ට හේරත්. සල්ලිවලින් කරගන්ඩ බැරි විදිහෙ උදව්වක්. මිනිහෙක් සබ්බ සන්තකේම වියදම් කරන්නෙ නැද්ද තමන්ගෙ ජීවිතෙ බේරගන්ඩ?"

වඩුගේ දිගටම කතා කළේය. අවසානයේ දී හේරත් නිහඬ විය. එම සාකච්ඡාව නිමා වූයේ නගරයේ සිටින අවමංගල්‍ය අධ්‍යක්ෂවරයෙකු වෙත හිස සහ සිරුර එක් කර දීමේ කොන්ත්‍රාත්තුව පැවරීමෙනි.

* * * * *

මනාව හැඳ පැලඳ ගෙන අවමංගල්‍ය ශාලාවෙන් නික්ම ගියායින් පසු, ජයසේකර හා අමරනාත් කීපවිටක්ම දුරකථනයෙන් කතා කළ ද, ඉන් පසු ඔවුන්ගේ කාර්යබහුල ලෝකය තුළ හේරත් යුවළට ඉඩකඩක් නොවීය.

කලකට පසු ප්‍රදේශයේ අවමංගල්‍යාධාර සමිතියේ සභාපති ධුරයට වඩුගේ පත්විය. හේරත් කාරක සභිකයෙකි. රැස්වීමක දී හෝ නගරයේ දී හේරත් හමුවන අවස්ථාවල දී වඩුගේ විහිළුවක් කරයි.

"ඊට පස්සෙ, දෙන දෙයියෝ ගෙට ගෙනවිත් දුන්නෙ නැද්ද?"

හේරත්ගේ මුහුණ, අප්‍රසන්නතාවකින් අඳුරු වෙයි. එහෙත්, ගෝලයින් දෙදෙනාගේ හිස සහ කවන්ධය එක්කර දීමෙන් ඔහු ලද මුදල, රජයෙන් අනුමත මූල්‍යායතනයක ස්ථාවර තැන්පත්ව පවතී.

වැසිබර සන්ධ්‍යා කාලයන්හි, නිවසේ ඉදිරිපසට වී, පාර දෙස බලා සිටින හේරත් මහතාට ගේට්ටු කණු ඇස ගැසෙයි. ගෝලයින් දෙදෙනාගේ හිස් ගෙඩි දෙක, ඒ මත තිබූ අයුරු මතකයට නැඟෙයි. හේරත් මහත්මිය ද අසල අසුනක හිඳ සිටී. දැන් ඇගේ සිහිකල්පනාව අඩුය. හිටිහැටියේ, කිසිඳු සම්බන්ධයක් නැති අතීත සිද්ධියක් ගැන කතා කරයි. ඒ සමඟම නැවතත් වර්තමානයට එයි. ඇතැම් විට ඇය මෙසේ අසයි.

"ඒයි ඔයාට මතකද අර වැස්ස. අදත් ඒ වගේ වහින්ඩයි යන්නෙ."

"මොන වැස්සද?"

"අර... අර... කවුදෝ අමුත්තෝ දෙන්නෙක් අපේ දිහාට ආපු දවස."

"මට මතක නෑ."

හේරත් මහතා ඉවත බලාගෙන මුමුනයි. හේරත් මහත්මියටද මොහොතකින් එය අමතක වනු ඇත.



කපිල කුමාර කාලිංග

*සම්මාන ලාභී ප්‍රබන්ධ කතානරුවෙකි. සංචාරක හා තිරැලිපි ලේඛකයෙකි.*




## වාර්තාකරුවන් නැති පුවත්පතක්

'ලෙ ජර්නල් දෙ මොන්ට්‍රියෙල්' ප්‍රංශ බසින් කැනඩාවේ පළවන ටැබ්ලොයිඩ් පුවත්පතකි. උතුරු අමෙරිකාවේ ප්‍රංශ බසින් පළවන වැඩිපුරම අලෙවියක් ඇති මේ පුවත්පතෙහි සුවිශේෂත්වය අලෙවිය නොවේ. එය වාර්තාකරුවන් නැති පුවත්පතක් වීමය.

"ප්‍රවෘත්ති තියෙන්නෙ එළියෙ. ජනතාව අතරෙ. මගේ මාධ්‍යවේදියෝ ඒ අය" පුවත්පතේ කර්තෘ ඩැනී ඩවුසෙට් පවසයි.

'ලෙ ජර්නෙල් දෙ මොන්ට්‍රියෙල්' පුවත්පතේ අයිතිකරුවන් වන ක්විබෙක් මීඩියා සමාගමේ නවතම නූතනකරණ ක්‍රමෝපාය මෙයයි. පුවත්පතට සෘජුවම සම්බන්ධ මාධ්‍යවේදීන් රැසක් මත යැපෙනු වෙනුවට බාහිර ලෝකයේ ජනතාවගෙන් පුවත් රැස්කර ගැනීමයි.



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# පුස්තකාලයාධිපතිගේ පර්යේෂක භූමිකාව

පුස්තකාලයාධිපතිගේ මූලික කාර්යභාරය වනුයේ මුද්‍රිත, විද්‍යුත් සහ අප්‍රකාශිත දැනුම අඩංගු මාධ්‍ය සංවිධානය කර පාඨක විඥාපන අවශ්‍යතා සපුරාලීමයි. සම්ප්‍රදායානුකූලව ඉටුකරමින් පවතින මෙම කාර්යය අර්ථවත්ව ඉටු කිරීමට පුස්තකාලයාධිපති පර්යේෂකයකු ලෙස නව භූමිකාවට ප්‍රවේශවීම අත්‍යවශ්‍යය. පර්යේෂණ තුළින් නව දැනුම උත්පාදනය වී සිදුකිරීමට පුස්තකාලයාධිපතිගේ සහය පර්යේෂකයන්ට ලබා දෙන අයුරු මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.

මානව වංශ කතාවේ ප්‍රවර්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී හා ගවේෂණයේ දී පුස්තකාල තුළ තැන්පත්ව පවතින දැනුම අඩංගු මාධ්‍යවලින් විශාල අනුබලයක් ලබා ගත හැකිය. අතීතය හැදෑරීමෙන් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනාවරණය කරගත හැකි අතර, අනාගතයේ දී සිදුවන වාස්තවික වෙනස්වීම්වල දී පර්යේෂණ පැවැත්වීම අඛණ්ඩව කරගෙන යා යුතු වේ. ජන සමාජයේ සෑම විවිධ විෂය ක්ෂේත්‍රයකම විප්ලවීය වෙනස්වීම් දැකිය හැකි අතර, එහි දී පර්යේෂණ අනාවරණවලින් වැදගත් මෙහෙයක් ඉටු වී ඇති බව පෙන්වාදිය හැකිය. මුද්‍රණ ශිල්පය, විදුලි හා චන්ද්‍රිකා සන්දේශනය, පරිගණක හා සන්නිවේදන තාක්ෂණය විසින් කරන ලද බලපෑම් නිසා මෙම තත්ත්වය තවදුරටත් විස්තාරණය වී ඇත. මෙම පසුබිම් තුළ පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය සම්ප්‍රදායානුකූල තත්ත්වයට පමණක් සීමා නොවී පර්යේෂණ පාදක විඥාපන සේවා සමුද්ධර්ණ කටයුතු දක්වා ව්‍යාප්ත වී ඇත. දැනුම ඒකරාශීකරණය, සංවිධානය, නිරාවරණය හා සංරක්ෂණය යන මූලික කාර්යයන්වලට අතිරේකව පර්යේෂණ තොරතුරු පාඨක විඥාපන අවශ්‍යතා සපුරාලීමේ ශාස්ත්‍රීය මෙහෙවරක් ඉටු කිරීම සිදු වී ඇත. එහෙයින් පුස්තකාලයාධිපති දැනුම අඩංගු මාධ්‍ය භාරකරුවකු, කළමනාකරුවකු, ප්‍රලේඛන නිලධාරියකු ලෙස පමණක් නොව, පර්යේෂකයකු ලෙසටත් වන පරිදි නිම් වළලු පුළුල් වී ඇත. මෙම ලිපියේ අරමුණ වනුයේ පුස්තකාලයාධිපති පර්යේෂකයකු ලෙස ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න විග්‍රහ කිරීමයි.

## පර්යේෂණය යනු කුමක්ද?

ප්‍රථමයෙන්ම පර්යේෂණය යනු කුමක්ද යන්න මනාව අවබෝධ කරගෙන තිබීම වැදගත්ය. කිසියම් ගැටලුවක් හඳුනාගෙන ක්‍රමික විධිමත් සැලැස්මක් යටතේ අදාළ සියලු කරුණු විමර්ශනය කර දත්ත රැස්කර ඒවා විශ්ලේෂණයට භාජනය කර එළඹි නිර්දේශ හා නිගමන, පර්යේෂණ, අනාවරණ යටතේ බෙදාහදා ගැනීම පර්යේෂණ යනුවත් හැඳින්වේ. එමෙන්ම පර්යේෂණ යන්න ගැටලු විසඳීමේ අරමුණින් න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම උපයෝගී කර ගැනීමක් ද විය හැකිය. ඒ අනුව පර්යේෂණ සැලැස්මක පහත සඳහන් අංශ ඇතුළත් වේ.

මාතෘකාව නිශ්චය කර ගැනීම හා සාහිත්‍ය ගවේෂණය මුලින්ම සිදුකළ යුතුය.

1. විමර්ශනයේ, ගවේෂණයේ අරමුණු නිශ්චය කර ගැනීම,
2. සීමාවන් අත්හදා බැලීම් හඳුනා ගැනීම,
3. පර්යේෂණ ගැටලුව නිර්මාණය කිරීම,
4. සුවිශේෂ උචිත දත්ත රැස්කිරීමේ ක්‍රමශිල්ප සැලැසුම්කරණය,
5. පර්යේෂණ නිගමනය සහ නිවැරදි කවරේ ද යන්න නිශ්චය කර ගැනීම,
6. වලංගු හා නිරවද්‍ය දත්ත රැස්කිරීම,
7. දත්ත විශ්ලේෂණ ක්‍රම පිරික්සීම,
8. පර්යේෂණ අනාවරණ වාර්තාකරණය.

ඉහත දැක්වූ ක්‍රියාවලියේ දී පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය වූයේ පර්යේෂකයාට අවශ්‍ය සාහිත්‍ය විමර්ශනය සඳහා අවශ්‍ය ප්‍රාථමික ද්විතීය හා තෘතීය මූලාශ්‍ර හඳුනාගෙන ඒවා ලබා දීමය. එහෙත් පුස්තකාලයාධිපති සාර්ථක වෘත්තිකයකු වීමට නම් විවිධ විෂය ක්ෂේත්‍රවල පවතින පර්යේෂණ, පර්යේෂණ හැකියාවන්, මීට පෙර සිදු වූ සමගාමී පර්යේෂණ හා සේවයේ අනාවරණ ඇතුළත් මූලාශ්‍ර පිළිබඳ පැහැදිලි දැනුමක් ලබා තිබිය යුතුය.

පුස්තකාලයාධිපතිවරයෙකුගේ පර්යේෂණ කුසලතාවන් වර්ධනය කර ගැනීමට හැකි එක් පර්යේෂණ ක්‍රමයක් වනුයේ කාර්යමූල පර්යේෂණ ක්‍රියාවලියයි. කාර්යමූල පර්යේෂණයක් මගින් දෛනිකව පවතින ගැටලුවක් සුවිශේෂව හඳුනාගෙන ඒ සඳහා යෙදිය යුතු ප්‍රතිකර්ම කෙටි කාලයක් තුළ දී ලබා දීමයි. උදාහරණයක් වශයෙන් පර්යේෂකයකු විසින් සාහිත්‍ය ගවේෂණය සිදුකිරීමේ දී සම්පාදනය කරගනු ලබන ග්‍රන්ථ නාමාවලීන් හඳුනා කෙසේ ඥානාත්මක තොරතුරු ඒකරාශී කළ යුතු දැයි පිළිගත් සම්මතයන් පැහැදිලි කර දීමක් සිදුකළ හැකිය. එමගින් පුස්තකාලයක මූලාශ්‍ර පිළිබඳව මෙන්ම ස්වකීය විමර්ශන සේවා කාර්යයේ දී ගුණාත්මක වර්ධනයක් අයත් කරගත හැකි වනු ඇත. මෙයට හේතුව පුස්තකාලයක් හැරුණු විට වෙනත් විෂය ක්ෂේත්‍රවල පර්යේෂණයන් ග්‍රන්ථ නාමාවලි සම්පාදනය පිළිබඳ විධිමත් සම්මුතීන් කෙරෙහි පූර්ණ අවබෝධයෙන් තොරවීමය.

## පුස්තකාලයාධිපති පර්යේෂණයන් භාවිත කළ යුත්තේ ඇයි?

පුස්තකාලයාධිපතිවරු විඥාපන කළමනාකරුවන් වශයෙන් පර්යේෂකයින්ට අවශ්‍ය කාලීන තොරතුරු සහ සාහිත්‍ය විමර්ශනයට අවශ්‍ය මූලාශ්‍ර ලබා දෙමින් සහය දක්වති. පර්යේෂකයෙකුගේ ස්වකීය වෘත්තික භාවය පර්යේෂණ තුළින් වර්ධනය කරගත හැකි වන අතරම, ආයතනික වශයෙන් සමස්ත ක්‍රියාවලීන්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති විය හැකිය. සමස්තයක් ලෙස පර්යේෂණ තුළින් පහත සඳහන් ප්‍රයෝජන ලබා ගත හැකිය.



- වර්තමානයේ කරගෙන කාර්යයන්වල ගුණාත්මකභාවය ඇගයීමට ලක් කිරීම
- පුස්තකාලයේ මෙහෙවර හා දැක්ම ප්‍රතිනිර්මාණය කර ගැනීම
- කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීම
- පරිසර සාධකවලින් කෙරෙන බලපෑම

ප්‍රලේඛන සේවාව යටතේ පුස්තකාලයාධිපති විසින් කිසියම් විෂයයක් ජාතික මට්ටමින් තෝරාගෙන නිමකරන ලද පර්යේෂණය ද්විතීය මට්ටමේ අංශයකට ඇතුළත් කරලීම සඳහන් කළ හැකිය. උදාහරණයක් වශයෙන්, කෘෂිකර්මය පිළිබඳව සිදුකළ පර්යේෂණවල ගුණාත්මක තොරතුරු පදනම් කරගෙන ජාතික මට්ටමේ නාමාවලියක් සම්පාදනය කළ හැකිය. වර්තමානයේ දී පර්යේෂණ තවදුරටත් හඳුන්වා දී ඇත්තේ ද්විතීය ක්‍රම පාදක ඇගයීම් ක්‍රමයක් වශයෙනි. ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණ තොරතුරු ඇතුළත් සමාජ විද්‍යා උපකරණ අනුක්‍රමිකව පර්යේෂකයන්ට සම්පාදනය වන අතර, එමඟින් පරීක්ෂකයින්ට ස්වකීය විෂය ක්ෂේත්‍රයේ සිදු වූ පර්යේෂණ හා පර්යේෂණ හැකියාවන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිය. එමෙන්ම පර්යේක්ෂකගේ කීර්තිනාමයේ වැදගත්කමට ද එය බලපෑමක් කරයි.

## පර්යේෂකයකු ලෙස පුස්තකාලයාධිපතියකුගේ ගුණාංග

පුස්තකාලයාධිපති භූමිකාව අර්ථවත් ලෙස හා දැනුම පාදක ඇගයීම මත ක්‍රියා කිරීමේ දී පුස්තකාලයාධිපතියකු පර්යේෂණ ක්‍රම, අනාවරණය, පර්යේෂණ හැකියාවන්, විඥාපන හා ප්‍රලේඛන සේවා ගැටලු මෙන්ම විෂය ක්ෂේත්‍රයේ වාස්තවික තත්ත්වයන් මැනවින් හඳුනාගෙන තිබීම ප්‍රයෝජනවත්ය. එහි දී පහත සඳහන් ගුණාංග පුස්තකාලයාධිපතියකු සතු විය යුතු බවට විද්වත් සංවිධාන අවධාරණය කර ඇත.

- විෂය ප්‍රවීණයන් පර්යේෂකයන් සමග සහසම්බන්ධතාවක් ගොඩනගා ගැනීම. පුස්තකාල එකතුන් සංවර්ධනයේ දී ඔවුන්ගේ යෝජනා, ප්‍රතිචාර, අදහස් සලකා බැලීම.

• ස්වාධීනව පර්යේෂකයන් සමග කටයුතු කිරීම.

• දැනුම යාවත්කාලීන කර ගැනීම.

• ද්විතීය මට්ටමේ පර්යේෂණ ප්‍රකාශනවල සැකැස්ම හඳුනාගෙන පුස්තකාල දැනුම අඩංගු මාධ්‍ය පදනම් කරගෙන ප්‍රලේඛන සේවා යටතේ ග්‍රන්ථ නාමාවලිය, තොරතුරු සංග්‍රහ, අනුක්‍රමිකතා, සාරාංශ සම්පාදනය කිරීම. මෙහි දී ග්‍රන්ථ විද්‍යාත්මක පරිපාලනය හා ජාතික සම්මුතීන්, ප්‍රමිතීන් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම.

• පාඨක විඥාපන අවශ්‍යතා ගවේෂණය සඳහා පාඨක සම්ප්‍රේෂණ, පාඨක අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම.

• පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු සාධිකාර මූලාශ්‍ර මඟින් ලබා දීමට කටයුතු කිරීම.

• ජාතික කලාපීය යන ජාත්‍යන්තර මට්ටමේ විෂය ක්ෂේත්‍රවලට අදාළ විඥාපන සේවාවන්, කාර්යයන් පිළිබඳව දැනුම ලබා ගැනීම, උදාහරණයක් වශයෙන් සාර්ක් කලාපීය සංවිධාන විසින් සිදුකෙරෙන විවිධ පර්යේෂණ පිළිබඳ දැනුමක් ලබා ගෙන ඒවා පර්යේෂකයන්ට දක්වා ස්වකීය විෂය ක්ෂේත්‍රවල දැනට කරගෙන යන පර්යේෂණ පිළිබඳ දැනුවත් කර ද්විත්ව කරණය වැළැක්වීමට කටයුතු කිරීම.

• සංවර්ධනය සඳහා විඥාපන සේවා තේමාව යටතේ ආයතනික පැතිකඩ ප්‍රවර්තන සාවද්‍යාන සේවාවන් ආරම්භ කර සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම.

• පුස්තකාල කාර්යමණ්ඩලයට පර්යේෂණ ක්‍රම පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.

• පුස්තකාලය තුළ ජාලයට අදාළ පර්යේෂණ එකතුවක් ආරම්භ කර ඒ පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීම.



● විශ්වවිද්‍යාල, පශ්චාද් උපාධි අධ්‍යාපන හා විද්වත් වෘත්තික සංවිධාන සමඟ නිරතුරු සබඳතා පවත්වා තොරතුරු රැස්කිරීම හා බෙදාහදා ගැනීම, පර්යේෂණ සාරසංග්‍රහ එකතුවට ඇතුළත් කිරීම.

● ජාතික මට්ටමේ ආයතනවලට පර්යේෂණ පිළිබඳ දැනුවත් කර එමගින් ප්‍රමුඛතාව අනුව සිදුවිය යුතු පර්යේෂණ පිළිබඳ දැනුවත් භාවය ලබා දීම, ප්‍රකාශන හිමිකම් නීති අනුව පාඨක විඥාපන සේවා සැපයීම.

## පර්යේෂණ තොරතුරු ඇතුළත් ද්විතීය මට්ටමේ මූලාශ්‍ර හා ප්‍රකාශන

- Dissertation Abstract
- National Register of Research (INDIA)
- On - Going Research Projects
- Social Science Citation Index (SSI)
- Science Citation Index (SCI)
- Lisa Plus - Library Science
- ERIC - Educational Resource Infactive
- SAP - Data Base (South Africa Data Base)
- COL - Commonwealth of learning
- Memory of the world - unesco
- Directory of Research

## ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පර්යේෂණ සාහිත්‍ය එකතුවක් ගොඩනැඟීම

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ පශ්චාද් උපාධි පාඨමාලාවල එක් අවශ්‍යතාවක් ලෙසට පර්යේෂණ නිබන්ධනයක් සම්පාදනය කර මණ්ඩලයකට යොමුකර සාමර්ථ්‍යයක් ලබා ගැනීම අනිවාර්ය කර ඇත. මේවායේ වැදගත්, ශාස්ත්‍රීය වැදගත්කමක් ඇත. මෙම පර්යේෂණ ජාතික මට්ටමින් එක් ස්ථානයක තැන්පත් කර තිබීම මෙන්ම ඒවායේ විද්‍යාත්මක තොරතුරු බෙදාහදා ගැනීම ද ප්‍රයෝජනවත්ය. එමගින් පර්යේෂණ ද්විත්වකරණය වැළැක්වීම මෙන්ම, රට තුළ සිදු වූ පර්යේෂණ පිළිබඳව මනා අවබෝධයක් ද ලබා ගත හැකි වනු ඇත. අන් රටවල දී විශ්වවිද්‍යාල සඳහා පශ්චාද් උපාධි නිබන්ධනයක් සම්පාදනය කිරීමෙන් පසු නීත්‍යානුකූලව අනිවාර්යයෙන්ම එක් පිටපතක් ජාතික පුස්තකාලයට භාරදිය යුතු වේ. ජාතික පුස්තකාල විසින් ඒවා පදනම් කරගෙන ද්විතීය මූලාශ්‍ර ප්‍රකාශයට පත්කරනු ලැබේ. එවැනි නෛතික පදනමක් ශ්‍රී ලංකාව තුළ ද සම්පාදනය කිරීම කාලෝචිතය.

## විමර්ශන


1. කොඩිතුවක්කු, ගොඩ්වින් (2003) කාර්ය මූල පර්යේෂණ
   මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය
2. ලංකාගේ, ජයසිරි, පශ්චාද් උපාධි නිබන්ධනයට උපදෙස්,
   කොළඹ, ගොඩගේ
3. පළිහක්කාර, හේමමාලි (1998) ගුරුවරයා සාර්ථක පර්යේෂකයෙකු ලෙස -
   මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය
4. රණසිංහ, පියදාස (2000) පුස්තකාලයාධිපතීත්වය, පුස්තකාල ප්‍රවෘත්ති
5. වීරසූරිය, ඩබ්ලිව්.ඒ. (2000) පුස්තකාලයාධිපති වෘත්තීය හා වර්තමාන පුස්තකාලයාධිපතීන්ගේ කාර්යභාරය
6. IFLA, Changing role of library and challenging tasks (2008) Hague, Netherland
7. Busha, Research methods in library science (1985)





**එච්.එම්. ගුණරත්න බණ්ඩා**

*ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු සහකාර අධ්‍යක්ෂවරයකි.*

කවිය

# අම්මා සහ අපේ ගේ



හෙට තමයි මේ කියන අපෙ ගෙදර
බවුන්ඩේසමේ සැමරුම් උළෙල
ගෙයක ඉන්නට හිතූ විසි වසර
සමරන්න එන්න හවසට මිතුර

ඉපල් වූ අතපයට පණ ආව
ගෙපැල් කැපූ දා රැඳුණු මඳහාස
බවුන්ඩේසම වගෙයි හැමදාම
සැලෙන්නෑ මහ පුදුම ඉවසීම

අත්තිවාරම් කොනෙක ලැග ඉන්න
බිත්ති හතරක් තිබේ බුදියන්න
පැත්තක් තිබේ එහිම ගිනි ගන්න
ඉන් හැකිය දුම් වැටිය දල්වන්න

ඇහේ සුද කම්කටොළු නො පෙනීම
ලිපේ බත ඉදෙනවා හැමදාම
හිතේ තෙත බත් පතක රැඳවීම
අපේ අම්මගෙ එකම සැනසීම

හදන තේ එක බොන්න, රහ තමයි
බෙදන බත ඉවරයක් නෑ තමයි
අතරමැද මහවැලිය වාගෙමයි
ගලන හැම වදනකම ප්‍රේමෙමයි

කතාවල පොඩි එකෙක් ඉන්නවා
වැඩිය නෑ පොඩියකුත් ගන්නවා
අත්තිවාරමෙන් පද පන්නවා
කවි එහෙම ලියන්නත් දන්නවා

කොච්චරක්වත් සෙනඟ ගැවසීම
නත්තලක් බැවින් අපෙ අම්මාට
මිත්‍රයනි මගෙ එකම ඉල්ලීම
ඇත්ත ඇරියුම මතක නැති වීම

බැලුවාට කමක් නෑ ඇගෙ මූණ
යුතුකම තමයි අවට නොපෙනීම
හදවතේ වේදනා දළුලෑම
ඇය හිතන දේ හිතට නො පෙනීම

ඇය ගිය පසුව හවස ඔරසමට
ගල් ගුහාවේ මරිය සුරුවමට
මාව අරගන්නෙපා සරදමට
අවුළපත තිබෙනවා ඔබෙ නමට

ඉස්තෝප්පුව හැදෙන තැන මෙන්න
හත් අට පොළක යසට ඉඳගන්න
ගල් බෝතලේ අඩිය හෙලවෙන්න
මස් ඉස්ටු අම්මගෙන්, වළඳන්න

පියස්සට බිතක්කන මුණ ගැහෙන
හිඩැස්සෙන් ගොයම් මැහි වැහි වහින
නො එන්නට ඇණ ගැසුව ඉටි කොළය
රැවල් ඔරුවක විලස අත වනන

බ්ලොක් ගල් වගේ පෙනෙන අර හරිය
උකස් ආයෝජනේ වැල් පොලිය
වැඩ වචන ගල් බාස්ලගෙ කුලිය
කපරාරු කරන්නට නම් බැරිය

බෙහෙතකට දිය බිංදුවක් නේන
නාන කාමරයෙ දර ගොඩ ගහන
බොලොක්කෙන් වතුර ඇදගෙන නාන
පිහිඹියා ගස තවම දළු දාන

සාලයත්, මුළුතැන්ගෙයත් මෙතන
පාරජම්බුලකිරණ හම ගසන
කාමරත් මෙතන මිදුලත් මෙතන
පාන්දර සමඟ රැය නිදි වදින

බවුන්ඩේසම දිගේ
මල් පෝච්චිත් තියා පේළියට
මෝජුවත් හදනවා
වම්බොටු ලියා දිගට හීනියට

එන්නැතුව ඉන්නෙපා
සොහොයුරනි දුක හිතෙයි හීනයට
අපෙ අම්මා ලැස්තියි
ඇය තාම නොදන්නා පාටියට



මංජුල වෙඩිවර්ධන

*සම්මානලාභී කවියෙකි, ප්‍රබන්ධ කතා රචකයෙකි, මාධ්‍යවේදියෙකි*

> තමන් සතු ධනය හෝ අවැසි නම් සිය ජීවිතය වුවද සිය මිතුරෙකුට පරිත්‍යාග කිරීමට සූදානම් මිනිසා ඔහු සතු කීර්තිය හෝ යහනාමය ඔහු සමඟ බෙදාගන්නට සූදානම් වන්නේ නම් ඒ ඉතා කලාතුරකිනි.
>
> - ප්‍රංශ දාර්ශනික මොන්ටේන් (1533 - 1592)



# අවවර්ධිත සමාජ සම්ප්‍රදායක හුදෙකලා වූ කලාකරුවා සයිමන් නවගත්තේගම

සයිමන් නවගත්තේගම නිෂ්පාදනය කොට සමාජගත කළ ප්‍රධාන කලා අංශය ලෙස මා දකින්නේ ඔහුගේ නවකතා හතයි. මෙකී නවකතා තුළ ක්‍රමික විකාශයක් දැකගත හැකිවන අතර, ව්‍යුහය සහ අර්ථ සම්පාදනය අතින් ගත්විට සයිමන් තුළ පැවැතියා වූ උභතෝකෝටික, අරාජිකත්වය ද දැකගත හැකි වන්නේය.

විශේෂයෙන් 'සුද්දිලාගේ කතාව' නවකතාව ඔස්සේ උතුරුමැද පළාතේ සමාජ ජීවිතය, එහි චර්යා පද්ධතිය සම්භාව්‍ය ෆ්‍රොයිඩියානු දැක්මකින් යුක්තව විවරණය කළ සයිමන් එවකට කියවා හමාර කර තිබුණේ හදාරා තිබුණේ, ටොල්ස්ටෝයි සොලොකෝව්, ලු ෂං ස්ටෙයින්බෙක් සහ ඩොස්ටොයෙව්ස්කි වැනි කතා කාරයින්ගේ නවකතාය. මෙයින් ඩොස්ටොයෙව්ස්කි හරස් පාරක ගමන් ගත් කතාකරුවෙක් වූයේය. පැහැදිලි ලෙසම මනෝ විශ්ලේෂණය අතින් ඩොස්ටොයෙව්ස්කි වඩාත් සිත්ගන්නාසුලු ආගම් චින්තනයකින් ද බකුනින්වාදී අරාජිකත්වයකින් ද යුක්තව තම චරිත හසුරු වන්නා වූ අතර, සමාජ ජීවිතය විවරණය කරනු ලබන්නේ පුද්ගලයා විෂය කොට ගනිමින් පුද්ගල නිදහස යන සංකල්පය උත්කර්ෂයට නංවමිනි. විශේෂයෙන් ඩොස්ටොයෙව්ස්කිගේ Demons නවකතාවේ ෂටොෂ් වැනි චරිතයක් මෙකී ආවේශය මැනවින් විදහා දක්වයි. මගේ තර්කය වන්නේ 'සුද්දිලාගේ කතාව' නවකතාවට ආවේගය අවුළුවන ප්‍රධාන ධාරා දෙකක් තුළ සයිමන් කොටු වූ බවයි. එනම් ග්‍රහණයට ගන්නා චරිතයත් සමාජ පරිසරයත් අතර ආතතිය අවුළුවා හට ගන්වන ඥාන සම්පාදනය එක් විෂය විලාසයකි. අනෙක් විලාසය වන්නේ චරිතයක් සුවිශේෂ තත්ත්වයන්ට මුහුණ දීමට සලස්වා සියුම් ලෙස සමාජ විවරණයේ යෙදීමයි. සයිමන් නවගත්තේගම සුද්දිලාගේ කතාවේ දී මෙම අංශ-විධික්‍රම දෙකම භාවිත කරන්නට උත්සාහ දරයි. මිනීමරුවන්, බිඳ වැටෙන ප්‍රාදේශීය ප්‍රභූ නායකයන්, වට්ටක්කා ගෙඩියට ලිංගික සූරාකෑමට නතුවන ගැහැනුන්ගේ ජීවිත විචිත්‍රවත් කරන්නට උත්සාහ දරයි. කටවචනයට



සයිමන්, ආරච්චිවසම් අහෝසිවීම, මුඩු ඉඩම් පනත ඇතිවීම කෙරෙහි ද තම අවධානයට ලක්වූ බව පැවසුව ද සුද්දිලාගේ කතාව එතරම් සූක්ෂ්ම ලෙස මෙම දත්ත දෙකම ජයග්‍රහණය කරන්නේ නැත. එහෙත්, අත්හදා බැලීමක් වශයෙන් සයිමන් ඉතා ප්‍රගතිශීලී ලෙස මෙම අන්ත දෙක සමග වැඩ කිරීමට උත්සාහ දැරීම අපගේ ගෞරවයට හේතු වෙයි.

තව ද චින්තනමය වශයෙන් මෙම උත්සාහයේ දී සයිමන් නවගත්තේගමහට ස්ටාලින්වාදී දේශපාලන උත්කර්ෂයත් ඒ තුළම පැවැතියාවූ දුබලතාවන් ද තමාටම අනන්‍ය කරගත් දහමකට අනුව කියැවූ ඩී.එච්. ලෝරන්ස් වැන්නන් ද බලපාන්නට ඇතැයි සිතිය හැක්කේය. විශේෂයෙන් හැට ගණන්වල දී වාමාංශික ව්‍යාපාරය ලෝක මට්ටමින්ම බෙදී කැඩී වෙන්වී යෑම, අමෙරිකානු කතාකරුවන් සහ ලතින් අමෙරිකානු කතාකරුවන් ගණනාවක් කරළියට පැමිණීම නිසා සයිමන් විය යුතු ආකාරයෙන්ම ඉහත සඳහන් කළ ආකාරයෙන් සමාජ සත්තා යථාර්ථවාදයේ දුර්වලතා කෙරෙහි සංවේදී වෙමින් සිටියේය. ලංකා සමාජයේ දී පනස් හයේ දරුවන් විසි වයස්වලට පැමිණෙමින් සිටි හෙයින් ඔවුන් නොයෙක් රොමැන්ටික්වාදී දේශපාලන සිහිනවලට එළඹෙමින් සිටි නිසා ද සයිමන් සියුම් ලෙස අනාගතය දුටුවේය. මෙය සයිමන්ට පමණක් සීමා වූවක් නොවේ, කාලය අවකාශය කළ ඉතිහාසය අනුව පරස්පරතා පැවැතිය ද ඇල්බෙයා කැමු The Rebel වැනි ලිපි සංග්‍රහයක් ඔස්සේ මෙම සංශයවාදී ගුණය සැලකළේය. ළඟ ඇති සමාජ විකාශනයත්, එහි ප්‍රතිවිරෝධතාත් අමතක කර දැමූ සයිමන් නවගත්තේගම ඉන් පසු සිය පැනත් සටහන් පොතක් ගෙන බැලූ බැල්මට විඥානවාදී යැයි කිවහැකි මාර්ගයකට හැරුණේය. (ජනතා විමුක්ති පෙරමුණේ සගයෝ බොහෝ විට මට එසේ පවසා ඇත්තෝය.) එහෙත්, ඒ මග සයිමන් වඩාත් දුරට ප්‍රතිවිරෝධතා සහිතව මරණය තෙක්ම ගමන් කළා යැයි මම අදහමි.

සයිමන් එසේ ගමන්ගත් මාර්ගයේ ඉතා විශිෂ්ට කෙටි නවකතා තුනක් සහ එක් දිගු නවකතාවක් රචනා කළේය. පිළිවෙළින් එකී නවකතා දඩයක්කාරයාගේ කතාව, සංසාරණ්‍යයේ දඩයක්කාරයා, සංසාරණ්‍යයේ උරුමක්කාරයා සහ සාපේක්ෂණී වූයේය. ද්‍රව්‍ය ලෝකයේ විපරිණාමයත්, මිනිස් අවිඥානයේ විපරිණාමයත් මනා ලෙස ග්‍රහණය කරගත් මෙම නවකතා විකල්ප ඉතිහාසයක්, එනම් රාජ්‍ය තන්ත්‍රයෙන් උත්කර්ෂයට නගනු ලබන

ඉතිහාසයෙන් පිටස්තර ඉතිහාසයක් මිනිසා විසින් නිර්මාණය කරනු ලබන බවත්, එහිම ගොදුරක් බවට පත්වන බවත් මෙම කෙටි නවකතා ඇසුරින් සයිමන් විදහාපෑවේය. එච්.එල්. සෙනෙවිරත්න, ලෙස්ලි ගුණවර්ධන, ජී.සී. මෙන්ඩිස් වැනි ඉතිහාසඥයන් විසින් දිගින් දිගටම මතු කරනු ලබන බහුත්වය, විවිධත්වය, සංකල්ප ගත කිරීම සයිමන් නවකතා සෞන්දර්යවේදය ඔස්සේ ගෙනහැර පෑවේය. එකී ගෙනහැර පෑම විටෙක යන් මටෙල්ගේ Life of Pi නවකතාවටත් රුෂ්ඩිගේ මුසල්මානුවාගේ අවසන් හුස්ම (The moor's last sigh) නවකතාවටත් සමාන වන අතර, තවත් අතකින් ඉසාක් බිෂෙවිස් සංගර් වැනි කතාකරුවෙකුගේ ගොවි රජ්ජුරුවෝ (King of the field) නවකතා තරමට පොහොසත් බව මගේ හැඟීමයි.

සයිමන් නවකතාකරුවෙක් ලෙස මෙම පොහොසත් බව සාක්ෂාත් කරගන්නේ කෙසේද? මගේ විශ්වාසය වන්නේ ඓතිහාසික භෞතිකවාදය ඔස්සේ සයිමන් ශිෂ්‍ය අවධියේ දී ලැබූ පන්නරයත්, පසුකාලීනව මහායාන සාම්ප්‍රදායික ලිපි ලේඛන පරිශීලනයෙන් ලබා ගත් දැනුමත් බවයි. චින්තනමය වශයෙන් සයිමන් නිතර දෝලනය වූ ආස්ථානයන් දෙකක් වූයේය. එනම් එක් පසෙක ශූන්‍යතාවයි. අනෙක් පස රැඩිකල් නැතහොත් පටිසෝතගාමිත්වයයි. පුද්ගල චින්තනය (සාමාන්‍ය මිනිසාගේ) සකස් වන්නේ සාමූහික වශයෙන් අභියෝගවලට මුහුණ දීමේ ආවේග වශයෙනි. ඒවා බොහෝ විට විමර්ශනාත්මක සංවාදශීලී වනවාට වඩා ලබ්ධික ස්වරූපයක් ගනී.

'නූතනවාදයේ සුවිශේෂත්වය වන්නේ අප මෝඩ ආගම්වාදී මිනීමරුවන් වෙනුවට බුද්ධිමය වශයෙන් උසස් මිනීමරුවන් තෝරා පත්කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීමයි.'

- ඇල්බෙයා කැමු (Rebellion and Murder)



*ඩොස්ටොයෙව්ස්කි*



*ඇල්බෙයා කැමු*

කැමුගේ මෙම ප්‍රකාශයට සමාන නූතනත්වයේ වියුක්තිය හඳුනාගත් ගොදුරු වීමකට තමා ලක්වී සිටින බව සයිමන් දැන සිටියේය. එහෙයින් නිර්මාණාත්මක ක්ෂේත්‍රයේ දී සයිමන් නවකතාව පිළිබඳ බරපතළ කියවීමක් නොමැති සමාජයක හුදෙකලාවට පත්වූයේය. සමාජයක් ලෙස නවකතා ඉල්ලා නොසිටින සමාජ පැවැත්මක් ඇති භූමියක එම හුදෙකලාවේම වින්දිතයා බවට පත්වීම තුළ ප්‍රතිවිරෝධතා බහුල චරිතයක් බවට පත්වූයේය. කුල පීඩනය, වර්ගවාදය, ප්‍රාදේශීයවාදය, ආගම්වාදය හිස ඔසවද්දී සයිමන් අතීත මිනිසාගේ අවිඥානය කරා සිය මනස යොමු කළේය. ආසියානු මිනිසාගේ පාතාලගත සොහොන් ගැබට සයිමන් ගමන් කළේ ප්‍රකෘති ලෝකයේ මගතොට මිනිස් සිරුරු දැවෙන්නා වූ සමයක එකී දවන්නන්ගෙන් යැපෙමිනි. එහෙයින් සයිමන් යනු, සයිමන්ගේ නවකතාව යනු අවවර්ධිත සමාජ සම්ප්‍රදායක හුදෙකලාව සටන් කළ සංකීර්ණත්වයයි.



**පියල් කාරියවසම්**

*සම්මානලාභී ප්‍රබන්ධකතා රචකයෙක්, නාට්‍යවේදියෙක්, රංගභූමි ක්‍රියාකාරිකයෙක් හා කෙටි චිත්‍රපට නිෂ්පාදකයෙකි.*

# පිකාසො
# නූතන චිත්‍ර/මූර්ති කලාවේ පුරාවත

අතීත සම්ප්‍රදායයන් ප්‍රතික්ෂේප කරමින්, කලාව පිළිබඳ නොයෙක් අත්හදා බැලීම් කරන ලද, ක්‍රි.ව. 1860-1970 දක්වා කාල පරිච්ඡේදය දළ වශයෙන් කලාවේ නූතන යුගය (modern age) ලෙස හැඳින්වේ. මේ යුගය ඇරඹෙන්නේ යුරෝපයෙනි. වඩාත් නිශ්චිතව, ප්‍රංශයෙනි.

මේ යුගයේ තරුණ කලාකරුවෝ - චිත්‍ර හා මූර්ති කලා ශිල්පීහු - කලා නිර්මාණයක් සඳහා ප්‍රවේශ වූ ආකාරය, එම කලා නිර්මාණයෙහි ප්‍රස්තුතය, කලා නිර්මාණය සඳහා උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය, සිය නිර්මාණයෙන් ප්‍රකාශ කිරීමට අපේක්ෂිත අදහස යන කාරණා සම්බන්ධයෙන් අත්හදා බැලීම් කළහ.

චිත්‍ර කලාව සම්බන්ධයෙන් මෙම පෙරළිය මුලින්ම සිදු කරන ලද්දේ ප්‍රංශ චිත්‍ර ශිල්පී ගුස්ටාෆ් කුබෙ (Gustave Courbet 1819-1877) විසිනි. රජුන්, ප්‍රභූන්, ක්‍රිස්තු චරිතයට සම්බන්ධ අවස්ථා, ග්‍රීක හා රෝම දේවකතා චිත්‍රයට හෝ මූර්තියට නැගීම මධ්‍යකාලීන හා පශ්චාත් මධ්‍යකාලීන අවධියෙහි කලා සම්ප්‍රදාය විය. කුබෙ එම සම්ප්‍රදායෙන් බැහැරව සාමාන්‍ය ජන



ජීවිතයේ අවස්ථා (භූමදානයක්, ගල් කඩන්නෝ හා නිදා වැටෙන නූල් කටින්නිය) සිතුවමට නැගුවේය.

කුබෙගෙන් පසු වින්සන්ට් වැන් ගෝ, පෝල් සෙසාන්, පෝල් ගවුගින්, හෙන්රි දෙ ටුලුස්, හෙන්රි මැටිසි, ජෝජස් බ්‍රාක්, අන්ද්‍රෙ දෙරායින් සහ පැබ්ලො පිකාසො වැනි කලාකරුවෝ පෙරට එති. මොවුහු ද තවත් බොහෝ තරුණ කවියෝ, ලේඛකයෝ සහ කලා විචාරකයෝ ද මේ යුගයේ තනි තනිව වුව ද එක් පොදු ප්‍රශ්නයකට පිළිතුරු සොයමින් සිටියහ; මේ යුගයේදී තවමත් ප්‍රචලිතව පැවැතියේ මධ්‍යකාලීන යුගයෙන් ණයට ගත් කලා සම්ප්‍රදායන්ය. එහෙත්, උදා වෙමින් පැවැති නූතනත්වය එම කලා සම්ප්‍රදාය මගින් නියෝජනය කළ හැකි ද? එම ප්‍රශ්නයයි. මේ වන විට ඡායාරූප ශිල්පය, චිත්‍රපටය, ශබ්ද සටහන් කිරීම (sound recording), දුරකථනය, මෝටර් රථය වැනි නව සොයා ගැනීම් සමාජය විපර්යාසයට ලක් කරමින් පැවැතියේය. ප්‍රංශ 'නවරැල්ලේ' (avant-garde) කලාකරුවන් ලෙස පෙර සඳහන් කලාකරුවන් මතු වන්නේ මෙවන් විපර්යාසයන් රැසකට යුරෝපය භාජනය වෙමින් පැවැති යුගයකදීය; ලෝක යුද්ධයක් හට ගැනීමේ අවදානමෙන් යුරෝපා රාජ්‍ය සාංකා සහගත අවධියක් පසු කරමින් සිටියදීය.

මොවුන් අතරින් විසිවන සියවස පුරා ලෝකයේ මහාද්වීප කිහිපයකම සිය නිර්මාණ ප්‍රභවය හා බලපෑම පැතිරවීමට සමත් වූ කලාකරුවා පැබ්ලො පිකාසොය.

පැබ්ලො, දියෙගො හොසේ, ෆ්‍රැන්සිස්කෝ දෙ පෝලා, ජුවාන් නොපොමුසෙනෝ, ට්‍රිනිඩෑඩ් රුයිස් යි පිකාසො (1881.10.25 - 1973.04.08) ස්පාඤ්ඤයේ ඉපිද, හැදී වැඩී චිත්‍ර කලාව හදාරා ප්‍රංශයට පැමිණි ස්පාඤ්ඤ ජාතිකයෙකි.

ප්‍රංශයේ හා යුරෝපයේ නන් දෙසින් පැමිණි විවිධ තරාතිරමේ තරුණ කලාකරුවෝ - මොවුන් අතර කවියෝ, ලේඛකයෝ, කලා විචාරකයෝ සහ චිත්‍ර ශිල්පීහු වූහ - ඔවුහු දහනව වන සියවස අවසාන භාගයේ දී සහ විසිවන සියවස මුල් අවධියේ දී පැරිස් නුවර



*ඇවිග්නොන්හි තරුණ ස්ත්‍රීන් පස්දෙනා*

සමීපයේ මොන්ට්මාත්‍රෙ කඳුගැටය මැදිකොට පිහිටි මොන්ට්මාත්‍රෙ දිස්ත්‍රික්කයෙහි පදිංචි වෙති. අඩු වියදමකින් ජීවත් විය හැකි වීම සහ නිවාස සඳහා බදු ගෙවීමට සිදු නොවීම, මොවුන් මෙම දිස්ත්‍රික්කයට ඇදී ඒමට බලපෑවේය. දිස්ත්‍රික්කයේ ජීවත් වූ වින්සන්ට් වැන් ගෝ, පියරි බුෆෝඩ්, ඇල්ෆ්‍රඩ් ජැරී, ජෝන් පෝල්, ජැකී විලන්, රේමන්ඩ් ඩ්‍යු කැම්ප්, හෙන්රි මැටිසි, අන්ද්‍රෙ දෙරායින්, සුසාන් වැලදොන්, පියරි ඔගස්ට් රෙනෝර්, එඩ්ගා ඩෙගාස්, මොරිස් උට්රිල්ලෝ වැනි කලාකරුවන් අතර ඇමෙරිකාවේ සිට මෙහි පැමිණ, කලක් නතරව සිට ආපසු ගිය කවියෝ, ලේඛකයෝ, කලා විචාරකයෝ හා පුවත්පත් කලාවේදීහු ද වූහ.

මෙම දිස්ත්‍රික්කයේම කොණක පිහිටි පැරණි ගොඩනැගිල්ලක වඩා දුගී කලාකරුවන් පිරිසක් වාසය කළහ. පිකාසො ද විසුවේ මෙහිය. අයහපත් කාලගුණය සහිත දිනවල,



*තැනින් තැන යන සර්කස් පවුල*

කඩා වැටෙන්නට මෙන් ඒ මේ අත පැද්දුණු මෙම ගොඩනැගිල්ල හඳුන්වන ලද්දේ 'බතාව් ලව් ආ' නමිනි. රෙදි සෝදන ඔරු යන අරුතින් බතාව් ලව් ආ නමින් හැඳින්වුණු මෙම ගොඩනැගිල්ලට එම නම ලැබුණේ එය සේන් නදියේ ඉවුරෙහි නවතා තිබුණු, ගං දියෙන් එහෙ මෙහෙ පැද්දුණු බෝට්ටු සිහිපත් කළ බැවිනි. ආර්ථික අපහසුතා පලා ගොස් කීර්තියෙන් ද, ධනයෙන් ද ආඪ්‍ය ජීවිතයකට ඔහුට පදනම වැටෙන්නේ ද ඔහු බතාව් ලව් ආ හි ගත කළ අවධියේදීමය.

වරින් වර ජීවිතයෙහි ඇති වූ පසුබෑම් සහිත කෙටි කාලවල දී හැර, අනූ එක් වියේ දී මෙලොවින් සමු ගන්නා තෙක්ම ඔහු චිත්‍ර ඇඳීමේ, මූර්ති නෙළීමේ, කැටයම් කලාවෙහි, මැටි බඳුන් ඉදිකිරීමෙහි යෙදුණේය. ඔහු ලෝකයට ඉතිරි කොට ගොස් ඇති කලා නිර්මාණ සංඛ්‍යාව පනස්දහස ද ඉක්මවයි.

කලා විචාරකයෝ පිකාසො චිත්‍ර ප්‍රධාන යුග කිහිපයකට බෙදා දක්වති. නිල් යුගය (1901-1905), රෝස යුගය (1905-1907), ඝනික යුගය (1907-1925), නව සම්භාව්‍ය යුගය හා අධි යථාර්ථවාදී යුගය මේ අතරින් ප්‍රධාන වේ.

පිකාසො බතාව් ලව් ආ හි ගත කළ මුල් අවධියේ චිත්‍ර නිල් යුගයට අයත් වෙයි. නිල් පැහැ පසුබිමෙහි අඳුරු නිල් පැහැයෙන් අඳින ලද මෙම චිත්‍රවලින් පිළිබිඹු වන්නේ දුගීකම හා කනස්සල්ලය. දුක්මුසු මුහුණු සහිත කෙසඟ ජනයා, විකටයන්, ගණිකාවන් මේ චිත්‍රවල දැකගත හැකිය. අඟහිඟවලින් කෙමෙන් මිදෙමින්, තමා අවට විසූ, බොහීමියානු ජීවිත ගත කළ කලාකරුවන්ගේ සමාගමය ද, ෆර්නැන්ඩේ ඔලිවියේ නම් තරුණ ස්ත්‍රියගේ ඇසුර ද ලබමින් ගත කළ මේ යුගයේ ඔහුගේ චිත්‍රවල තේමාවන් මෙන්ම වර්ණ වින්‍යාසය ද වෙනස් වෙන්නට වෙයි. චිත්‍රවලට ලා රෝස

හා තැඹිලි පැහැය යොදා ගැනෙයි. මේ යුගයේ ඔහුගේ ජනප්‍රිය තේමාවන් වන්නේ විකටයන් හා සර්කස්කාරයන්ය. "තැනින් තැන යන සර්කස් පවුල" මේ අවධියට අයත් ඔහුගේ විශිෂ්ට නිර්මාණය ලෙස සැලකේ. යුරෝපයේ නන්දෙසින් පැමිණ මෙම දුගී දිස්ත්‍රික්කයට ඒකරාශි වී අසම්මත ජීවිත ගත කළ මෙම කලාකරුවන්ගේ අභිසාරී ජීවිතය ඔහු මෙම චිත්‍රයෙන් සංකේතවත් කරයි. ඔවුන් දුගියන් වුව ද හුදෙකලා වුව ද, ඔවුන් භුක්ති විඳි ස්වාධීනත්වය මෙම කැන්වසයෙහි ඔහු චිත්‍රණය කරයි.

1907ට අයත් "ඇවිග්නොන් හී තරුණ ස්ත්‍රීන් පස්දෙනා" (Les Demoiselles d' Avignon) තෙල් සායම් චිත්‍රය විසිවන සියවසේ චිත්‍ර කලාව කෙරෙහි ඉමහත් බලපෑමක් කළ පිකාසො නිර්මාණය ලෙස සැලකේ. මෙයට කරුණු දෙකක් බලපා ඇත.

1. ඝනික යුගයේ ආරම්භය සනිටුහන් වන චිත්‍රය මෙයයි.

2. අප්‍රිකානු කැටයම් හා මූර්තිවලින් පිකාසො ලද ආභාසය මෙම නිර්මාණයෙහි දක්නට ලැබෙයි.

කලා විචාරකයන් පෙන්වා දෙන අන්දමට පිකාසො නූතන චිත්‍ර හා මූර්ති කලාවට ලබා දුන් 'වටිනාම' ත්‍යාගය ඝනික ශෛලියයි. පසු කලෙක චිත්‍ර ශිල්පී ජෝජස් බ්‍රාක් හා එකතු වී ඔහු මෙම ශෛලිය දියුණු කරයි.

පිකාසො කලක් පැරීසියේ ට්‍රැකෙදෙරෝ කෞතුකාගාරයෙහි ඇති අප්‍රිකානු කැටයම් හා මූර්ති අධ්‍යයනය කිරීමේ යෙදුණේය. ප්‍රංශය, අප්‍රිකාව පුරා යටත්විජිතකරණයෙහි යෙදීමේ අතුරු ඵලයක් ලෙස අප්‍රිකානු යටත්විජිතවලින් රැගෙන එනු ලැබූ මෙම කෞතුක භාණ්ඩ පිළිබඳව පෝල් ගවුගින්, මැටිසි වැනි කලාකරුවෝ පිකාසොට පසුකාලීනව උනන්දුවක් දැක්වූ අතර, එම කෞතුක භාණ්ඩවලින් සිය කලා කෘති සඳහා ආභාසය ලැබූහ. මෙම ආභාසය මුල් වරට විද්‍යමාන වන්නේ 'ඇවිග්නොන් හි ස්ත්‍රීන් පස් දෙනා' චිත්‍රයෙහි දකුණු පස ස්ත්‍රී රූප දෙකෙහිය.

අප්‍රිකානු ගෝත්‍රික ජනයා මෙම වෙස්මුහුණු හෝ කැටයම් නෙළුවේ සෞන්දර්යාත්මක අරමුණකින් නොවේ; වනාන්තරයේ ජීවත් වීමේ දී ඔවුනට අවිෂය වූ ඇතැම් අනර්ථකාරී දුෂ්ට බලවේග සමග ගනුදෙනු කිරීමේ දී අතරමැදි බලයක් ලෙස ඔවුහු මෙම වෙස්මුහුණු භාවිත කළහ; පිකාසො ප්‍රමුඛ කලාකරුවන් අප්‍රිකානු වෙස්මුහුණු අර්ථ නිරූපණය කළේ ඒ ආකාරයෙනි. එමෙන්ම අප්‍රිකානු වනචාරී ජනයා තුළ වූ ප්‍රෞඪත්වය මෙම වෙස්මුහුණු තුළින් දිස්වන බව පිකාසො විශ්වාස කළේය; මෙම වෙස්මුහුණු හා කැටයම්වල ප්‍රකාශන ශෛලිය පිකාසොගෙ සිත් ගත්තේය. විචාරකයන් 'නීග්‍රෝ යුගය' යනුවෙන් හඳුන්වන කාල පරාසයට අයත් ඔහුගේ චිත්‍ර හා මූර්තිවල මෙම ලක්ෂණ දක්නට ලැබේ.

නූතන චිත්‍ර කලාවේ අමූර්ත (abstract) සම්ප්‍රදාය ආරම්භ වන්නේ ද 'ඇවිග්නොන්හි ස්ත්‍රීන් පස්දෙනා' චිත්‍රයෙනි.

නව රැල්ලේ කලාකරුවන් විසින් හඳුන්වා දෙනු ලැබූ අධිසත්තාවාදී හෙවත් අධි යථාර්ථවාදී (surrelist) සම්ප්‍රදාය මෙම යුගයේ චිත්‍රයට හා මූර්තියට පමණක් නොව, ලේඛනයට - ගද්‍යයට හා පද්‍යයට ද ඇතුළු විය.

හෘදභ්‍යාන්තරයෙහි සැඟවුණු, ජීවිතය පිළිබඳ අවිනිශ්චිත, සාංකා සහගත ගුඪ සිතිවිලි හා අත්දැකීම් ප්‍රකාශ කිරීමට නවරැල්ලේ කලාකරුවෝ මෙම සම්ප්‍රදාය යොදා ගත්හ. එතෙක් පැවැති කිසිදු සම්ප්‍රදායක් ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව ඔවුන්ගේ මතය වූයේය.

පිකාසොගෙ නිර්මාණවල මෙම ක්‍රමය වඩාත් ප්‍රකට වන්නේ ඔහු ඇසුරු කළ ස්ත්‍රීන්

සිත්තමට නැඟීමේදීය. ඔවුන්ගේ භාවයන් සිතුවමට නැඟීමේ උචිතම ක්‍රමය මෙම සම්ප්‍රදාය තුළ ඔහුට හමු විය.

පිකාසො චිත්‍රවල හමුවන 'වෘෂභ මානවයා' (minatour) 'ශිෂ්ඨ සම්පන්න' මිනිසාගේ මෘග අභ්‍යන්තරය පෙන්වීම සඳහා ඔහු ග්‍රීක මිථ්‍යාකතාවලින් ගත් සංකේතයකි. නිදා සිටින ස්ත්‍රියක සමීපයේ සිටින වෘෂභ මානවයා, වෘෂභ මානවයකුගෙන් ස්ත්‍රියක බේරා ගැනීමට තැත් කරන මානවයකු ආදී වශයෙන් මෙම රුව දැක්වේ. ශිෂ්ට මිනිසා තුළ නිදන මෘගයා වෘෂභ මානවයාගෙන් සංකේතවත් කළ පිකාසො ගොන් පොරය දුටුවේ එම වෘෂභයා පරාජයට පත් කිරීමට මිනිසා ගන්නා මාරාන්තික වෑයම විය හැකිය.

යුද්ධයේ අමානුෂිකත්වය හා භීෂණය පෙන්වන ඔහුගේ 'ගුවර්නිකා' චිත්‍රය සඳහා ද ඔහු යොදා ගන්නේ අධි තාත්වික ශෛලියයි. ස්පාඤ්ඤයේ බාස්ක් ප්‍රදේශයේ පිහිටි ගුවර්නිකා ගම්මානයට ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ දී ජර්මානු හා ඉතාලි යුද අහස් යානා මඟින් බෝම්බ හෙළීමෙන් සිදු කරන ලද මහා සංහාරය සංකේතවත්ව නිරූපණය කරමින් සුදු, කළු හා අළු යන පැහැයන් පමණක් යොදා ගනිමින් ඔහු මෙම සුප්‍රකට තෙල් සායම් සිතුවම ඇන්දේය.

පිකාසො මූර්ති ශිල්පියෙහි ද විප්ලවීය වෙනසක් ඇති කළේය. ඔහුගේ මූර්ති ශිල්පය තුළ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් හඳුනාගත හැකිය.

පුරාණ අප්‍රිකානු වෙස්මුහුණු හා කැටයම්වලින් ද ආදි කල්පික අයිබීරියානු පිළිරූවලින් ද (පුරාණ පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ කෞතුක පිළිරූ) ලත් ආභාසය පළමුවැන්නයි.

දෙවැන්න, අවට පරිසරයෙහි හමුවන අබලි ද්‍රව්‍ය ඒ සඳහා යොදා ගැනීමය. ඔහු මෙවැනි අබලි ද්‍රව්‍යයක, මූර්තියක් සඳහා යොදා ගත හැකි කොටසක් හෝ එසේ නොවේ නම් සමස්ත මූර්තියම දුටුවේය. පසුකලෙක, මෙවැනි කලා අභ්‍යාසයන් සුලබ වුව ද, කලාව හා කලා නිර්මාණ පිළිබඳව එදා මධ්‍යම පන්තිය තුළ පැවැති හිස් උඩඟු ආකල්පවලට ප්‍රංශ නව රැල්ලේ කලාකරුවන් නිර්දය ලෙස පහර එල්ල කළ එම යුගයේ දී පිකාසොගේ මෙවැනි අභ්‍යාසයන් විප්ලවීය වූවා නිසැකය. කසළ ගොඩක දක්නට ලැබුණු ඉවත ලූ භාණ්ඩයකින් ඔහුගේ සිතෙහි යම් මූර්තියක ආකෘතියක් සනිටුහන් වූ විට, ඔහු එම භාණ්ඩය ප්‍රධාන අංගය ලෙස යොදා ගනිමින් පිළිරුවක් ඇඹුවේය. ඔහු ඇඹූ මෙවන් බොහෝ පිළිරූ අතර කොකා, පැටියා තුරුළු කරගත් වැඳිරිය, ගැබ්බර එළුදෙන ආදී සත්ව පිළිරූ මෙන්ම ස්ත්‍රී පිළිරූ රැසක් ද දැකගත හැකිය.

නූතන කලාව තුළ පිකාසො සිදු කරන ලද තවත් සුවිශේෂී වෙනසක් වන්නේ කලාව (aesthetic art) සහ ශිල්පය (craft) වෙන් කෙරෙන පැහැදිලි රේඛාවක් වී නම් එම රේඛාව බොඳ කොට දැමීමය. කලාව හා ශිල්පය අතර අන්‍යෝන්‍ය සබැඳියාවක් පවතින බව පෙන්වා දීමය.

පපියේ කොලියේ යන ප්‍රංශ වදනින් හැඳින්වුණු ඉරා ගත් පුවත්පත් කැබලිවලින් චිත්‍රයක් නිර්මාණය කිරීමේ කලාව හෙවත් කොලාජ් ක්‍රමය සහ යම් අදහසක් ප්‍රකාශ කිරීම හෝ වඩා තීව්‍ර කිරීම සඳහා සිතුවමක් තුළට බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය කිහිපයක් ස්ථාපනය කිරීම (installation) නූතන කලාවට ඔහු හඳුන්වා දුන් ශිල්ප ක්‍රම දෙකකි.

කලාකරුවා වෙනම ජීවිකාවක වැජඹෙන්නෙකු නොව, සමාජයේ තවත් එක් ශිල්පියකු බව අවධාරණය කරමින් ඔහු වාත්තු ශිල්පීන්, කුඹල්කරුවන් සමඟ සිය නිර්මාණ නිමහම් කිරීම සඳහා වෙහෙසුණු බව සඳහන්ය.

පන්ති මායිම් හෝ ඨානාන්තරයන් නොසැලකූ ඔහු ගත කළේ සම්මත විරෝධී ජීවිතයකි.

මධ්‍යකාලීන කලා ධාරාවෙන්ම පරිණාමය වූ භාවිතයෙන්ම නීරස බවට පත්ව තිබුණු සමකාලීන ප්‍රධාන ධාරාවේ කලා අභ්‍යාසයන්ගෙන් බැහැරව නව මඟක් ගත් පිකාසො ප්‍රමුඛ නවරැල්ලේ කලාකරුවන්ට වුවමනා වූ ප්‍රධාන කාරණයක් තිබිණි; වගා කර ගත් උසස් කලා රසඥතාවක් තිබේය යන උඩඟු ආකල්පයෙන් කල් ගෙවූ මධ්‍යම පන්තියට ද ඔවුන්ගේ හිස් රසඥතාවට ද පහර එල්ල කිරීමය. ඔවුන් ගෙවූ අසම්මත ජීවිතම මධ්‍යම පන්තියට එල්ල කළ පහරක් වූයේය. කලා නිර්මාණ සිය විසිත්ත කාමරයේ සැරසිලි භාණ්ඩ ලෙස පමණක් ප්‍රයෝජනයට ගත් 'කලාව අත පත ගාන' මධ්‍යම පාන්තිකයන් පිකාසො ප්‍රමුඛ නව රැල්ලේ කලාකරුවන්ගේ දැඩි අප්‍රසාදයට හා විවේචනයට ලක් විය.

කලාව සැබැවින්ම සෞන්දර්යාත්මක අභ්‍යාසයක් ද? නවරැල්ලේ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ගේ නිරන්තර විමංසනයට භාජනය වූ මෙම ප්‍රශ්නයට පිකාසො එඩිතරව පිළිතුරු සැපයුවේය. චිත්‍රය/මූර්තිය හුදෙක් චිත්‍ර/මූර්ති ශිල්පියාගේ ආත්මගත අභ්‍යාසයකි. ඔහු සිය අභ්‍යන්තර හැඟීම්, ආකල්ප විරෝධතා පමණක් නොව, සමාජ සම්මුතීන්ට අනුව ශිෂ්ට සම්පන්න ලෙස ප්‍රකාශ කළ නොහැකි හැඟීම් පවා ප්‍රකාශ කිරීම සඳහා යොදා ගනු ලබන මාධ්‍යයකි යැයි ඔහු ප්‍රකාශ කොට ඇත.

පිකාසො විසින් සොයා ගනු ලැබූ ඝනික සම්ප්‍රදායෙන් ලොව පුරා කලාකරුවෝ ආභාසය ලැබූහ. මොවුන් අතුරින් රෝයි ලිච්ටෙන්ස්ටයින්, විලෙම් දෙ කූනින්, ජැක්සන් පොලොක්, ජැස්පර් ජෝන්ස් සහ ආෂිල් ගෝර්කි වඩා ප්‍රකටය. ඝනික සම්ප්‍රදායෙන් ආභාසය ලැබ යුරෝපයේ කලා සම්ප්‍රදායන් රැසක් බිහි විය. ඉතාලියෙහි බිහි වූ අනාගතවාදය (Futurism), රුසියාවේ අති ඝනිකවාදය හා අභිසංස්කරණවාදය (Supremacism & Constructionism), බ්‍රිතාන්‍යයේ බිහි වූ සලාගතිකවාදය (Votertism), ඕලන්දයේ දෙ ස්ටිජ්ල් (The Style - de stijl), ජර්මනියේ භාව ප්‍රකාශනවාදය (Expressionism) හා පළමු ලෝක යුද්ධයට විරෝධය දැක්වීමක් ලෙස ස්විස්ටර්ලන්තයේ මතු වූ ඩඩා (Dada) සම්ප්‍රදාය ද ඝනික සම්ප්‍රදායේම දරුවෝය.

විසිවන සියවසෙහි ජගත් කලා පුරාවතෙහි මෙසේ පිකාසො නාමය යෝධ අකුරින් සනිටුහන්ව පවතින අතර, විසිඑක්වන සියවසේ චිත්‍ර හා මූර්ති කලාව පුරා වුව ද තවමත් වැටී තිබෙන්නේ ද පිකාසො සෙවණැල්ලයි.

මන්තිකා

## ශ්‍රමය පූජනීයයි

තමන් සිටින තත්ත්වයට වඩා යහපත් තත්ත්වයට පත්වීමට මිනිසා තුළ පවත්නා අතෘප්තිකර ආශාව පූජනීය ය. තමන් විසින්ම නිර්මාණය කරන ලද වැදගැම්මකට නැති දැ පිළිබඳව ඔහු තුළ හටගන්නා වෛරය පූජනීයය. දැඩි ශෝකය, ඉරිසියාව, අපරාධ, රෝග පීඩා, යුද්ධය සහ මිනිසා එකිනෙකාට කරන එදිරිවාදිකම් දුරු කිරීම සඳහා ඔහු තුළ පවත්නා අභිලාෂය පූජනීයය. එමෙන්ම ඔහුගේ ශ්‍රමය පූජනීය වේ.

- රුසියානු ලේඛක මැක්සිම් ගෝර්කි

# පොතක වත




**කපිල කුමාර කාලිංග**
කිංකිණි ක්‍රියේෂන්ස්
පිටු 256
මිල රු. 450.00




**පරිවර්තක:**
**අසෝක නිස්සංක**
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
පිටු 366
මිල රු. 500.00




**සිරි ඉපලවත්ත**
සරසවි ප්‍රකාශකයෝ
පිටු 158
මිල රු. 275.00




**පරිවර්තක:**
**ආනන්ද සෙල්ලහේවා**
සූරිය ප්‍රකාශකයෝ
පිටු 340
මිල රු. 392.00



**නිහාල් රංජිත් ජයතිලක**
කිංකිණි ක්‍රියේෂන්ස්
පිටු 263
මිල රු. 400.00




**පරිවර්තක:**
**මනෝ ප්‍රනාන්දු**
සූරිය ප්‍රකාශකයෝ
පිටු 344
මිල රු. 384.00




මාලිමා ප්‍රකාශන
පිටු 447
මිල රු. 400.00




**සිරිල් චන්ද්‍රසේකර ගුණවර්ධන**
සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන
පිටු 200
මිල රු. 350.00




**වෛද්‍ය නිහාල් රංජිත් කළුපහන**
සරසවි ප්‍රකාශකයෝ
පිටු 136
මිල රු. 220.00




**Senaka Bandaranayake**
Social Scientists Association
පිටු 349
මිල රු. 760.00




**Daya Amarasekara**
Ariya Publishers
Warakapola.
Pages: 152
Rs. 975.00




**(Autobiography of Ven. Bhikkuni Prof. Kolonnawe Sumana**
Akna Publishers
පිටු 243
මිල රු. 540.00




**වැවල පී. ප්‍රේමදාස**
සරසවි ප්‍රකාශකයෝ
පිටු 195
මිල රු. 350.00




**Wimarshana Wijesooriya**
පිටු 299
මිල රු. 2691.00




**Jane Derges**
Routledge Taylor & Francis Group
පිටු 212
මිල රු. 8995.00




**K.M. de Silva**
Vijitha Yapa Publication
පිටු 338
මිල රු. 1000.00




**Deniel Bass**
